# රණවරුණ


ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි

27 වන කලාපය | 2018 - පෙබරවාරි, මැයි




වොලිබෝල් ශූරතාවය - පිරිමි



නෙට්බෝල් ශූරතාවය - කාන්තා



වොලිබෝල් ශූරතාවය - කාන්තා

## විරු තරු බැබළුණු කෙළි බිමේ පෙළහර

යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් හා අන්තර් ඒකක නෙට්බෝල් තරඟාවලිය ඉකුත් මැයි 29 සිට ජූනි 01 දක්වා මහරගම ජාතික තරුණ සේවා සභා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. රෙජිමේන්තු 20 ක් හා ඒකක 06 ක සහභාගීත්වයෙන් පැවති එම තරඟාවලියෙහි සමාප්ති දින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ස්වේච්ඡා බළසේනා සේනාවිධායක තුමන් සහභාගී විය.

ස්වේච්ඡා බළසේනාව වසරක් තුළ සංවිධානය කරන දැවැන්ත ක්‍රීඩා සැණකෙළියක් වූ ඊට ජාතික හා ජාත්‍යන්තරය නියෝජනය කරන ක්‍රීඩා තරු රැසක් සහභාගී වූහ. එදින ඔවුන් පෑ ක්‍රීඩාශීලී පෙළහර  ක්‍රීඩාංගනය වර්ණවත් කරන ලද්දේ රැස්ව සිටි ප්‍රේක්ෂකයින්ගේ ඔල්වරසන් හඬ මධ්‍යයේය.






# එස් 5 සංකල්පය ප්‍රායෝගික කරවමින්

ස්වේච්ඡා බළසේනා සාමාජිකයින් තුළ යහපත් නිරවුල් මානසිකත්වයක් ඇති කොට ඔවුන්ගේ වෘත්තීය ඵලදායිතාවය වර්ධනය කිරීමද, ඔවුන්ගේ පුද්ගලික ජීවිත ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවැසි මඟ පෙන්වීම ලබා දීමද, අද වනවිට කාලීන අවශ්‍යතාවක්ව ඇත. එකී අරමුණ පෙරදැරිව ස්වේච්ඡා බළසේනා සේනාවිධායකගේ උපදෙස් හා මගපෙන්වීම මත ස්වේච්ඡා බළසේනා මූලස්ථාන ශාඛා අංශ අතර මෙන්ම ස්වේච්ඡා ඒකක හා ස්වේච්ඡා පුහුණු පාසල් අතර එස් 5 සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරවීමේ තරඟාවලියක් දියත් කරන ලදී. එහිදී එස් 5 සංකල්පය සාර්ථකව ක්‍රියාත්මක කළ බළඇණි ඇගයීමට ලක්කොට ඔවුනට සම්මාන පිරිනැමීමක් සිදුකරන ලදී.

ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි ගේ ප්‍රධානත්වයෙන් පත්කළ විශේෂ මණ්ඩලයක් මගින් ඒ ඒ ඒකක පුද්ගලිකව පරීක්ෂාවට භාජනය කොට අදාළ ජයග්‍රාහකයින් තෝරාගැනීම සිදුකරන ලදී. ජයග්‍රාහී ඒකක වෙත සම්මාන සහතික පිළිගැන්වීම ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී ගේ අතින් ඉකුත් ජූනි 1 දින මහරගම තරුණ සේවා සභා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී සිදු කෙරිණ.


ප්‍රථම ස්ථානය : 15 ගැහේබ


දෙවන ස්ථානය : 25 ශ්‍රීලංජාආබමු


තෙවන ස්ථානය : 5 ශ්‍රීලංසිරෙ

## ඇතුළු පිටු

04 රණවිරුවන් සතු සුවිශේෂි හැකියාවන් ඇගයුමට
08 යුද හමුදා ස්වේච්ඡා බළසේනා පුහුණු පාසල දියතලාව
12 සාර්ථකත්වයට මග
15 කිරුළ මුතු ලිහී සර සර හඩින් වැගිරෙනා
19 කෙළි බිමෙහි පෙන්නු විරු දිරි හපන්කම්
27 විජිත පුර විත්ති
33 ඒකක අභිමන්
37 සුභ මොහොතින් නව තනතුරු ලැබ
38 පය ඇඳි බිම ළය රැඳි මතක
42 බීලා ගෙදර නොගිය රැයක්
44 එම්.බී.ටී. විපය
කෙටි කතාව
46 රහ කැලි




# රණවරුණ

## ප්‍රකාශනය
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය

## උපදේශක මණ්ඩලය
මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි
කර්නල් කේපී නුගේගොඩ ආර්ඩබ්ලිව්පී අර්එස්පී
කර්නල් එම්ජීඑන්බී මහතුවක්කාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

## සංස්කාරක
මේජර් සුපිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ

## "රණවරුණ" කාර්ය මණ්ඩලය
ලුතිතන් එච්පීඑම්පීබීඑම් පළිහක්කාර ශ්‍රීලංජාආබමු
ලා/කෝප්‍රල් සුජීව කුමාර කෝවිලතැන්න (සැකසුම් සහය)
ලා/කෝ දයාරත්න ඩීජීඑස්
ලා/කෝ කීර්තිරත්න ඒඑච්ටීඑස්එස්
(පරිගණක නිමැවුම් සහයක)

බනි II සුසිරිපාල ඩබ්ලිව්එම්
කෝප්‍රල් කුමාර පීඩබ්ලිව්ඩබ්ලිව්පීඑස්එම්
කෝප්‍රල් සාලිය බණ්ඩාර යූඕවී
ලා/කෝප්‍රල් චාමර එම්කේආර්එල්
සාසෙ බොතේජු පීඩබ්ලිව්ඩබ්ලිව්
සාසෙ පෙරේරා එච්ආර්පීඩබ්ලිව්

## රණවරුණ ලිපිනය
සංස්කාරක
රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය
යුද හමුදා කඳවුර
සාලාව - කොස්ගම

ඊමේල් ranawaruna@yahoo.com
දුරකතන - 036 2255 362
ෆැකස් - 036 2255 709

## පරිගණක නිර්මාණය හා මුද්‍රණය
නියෝ ග්‍රැෆික්ස්


# රණවිරුවන් සතු සුවිශේෂී හැකියාවන් හඳුනා ගනිමු.

යුද හමුදා සමාජිකයින් සතු විවිධ වූ හැකියාවක් හඳුනාගෙන ඔවුනට ඒ ඔස්සේ ඉදිරියට පැමිණීමට මං පෙත් විවර කරදීම ඒ ඒ මට්ටම්වල නායකයින්ගේ වගකීමකි. විශේෂයෙන්ම ඒ සඳහා නිසි ඇගයුම් ලබාදී ඔවුන්ව දිරිමත් කිරීම තුළින් බොහෝ ප්‍රතිඵල අත්කර ගතහැකිවනු ඇත.

යුද සෙබළා යැයි කියු සැනින් ඕනෑම අයෙකුට නිතැනින්ම සිහියට එනුයේ යුද්ධය හා සම්බන්ධ මතකයකි. නමුත් සෙබළා යනු යුධ බිම තුළ පමණක් සිය මෙහෙවර ඉටු කරන්නෙක් නොවේ. එදවස රණබිමෙහි සිය මෙහෙවරට කැපවූ යුද සෙබළුන් තුළ ඉන් ඔබ්බට විහිදුණු කොතෙකුත් දක්ෂතා පවතින්නේද යන්න අමුතුවෙන් කිව යුතු නොවේ. ඊට හේතුව නම් රණවිරුවන් විවිධ පැතිකඩ ඔස්සේ සිය හැකියාවන් වර්ථමානයේ සමාජ ගතකොට ඇති හෙයිනි. සාහිත්‍ය, කලා හා සෞන්දර්ය අංශයෙන්ද තාක්ෂණික හා වෙනත් හැකියාවන් ඔස්සේද ඔවුන් සිය හැකියාවන් කරලියට ගෙන ඇති අයුරු පුදුම සහගතය. ඇතැම් විට ඔවුන් සතුවන එකී සුවිශේෂී හැකියාවන් සිවිල් සමාජයේ සිටින අයවළුන් පවා අභිබවා යන තරම්ය.

විශේෂයෙන්ම යුද්ධය නිමාවත් සමඟ දැන් දැන් එකී සෙබළු වෙනත් ඉසව් ඔස්සේ තම හැකියාවන් එළිදැක්වීමට උනන්දුවන සෙයක් පෙනේ. ඉහත තත්වය අබබෝධ කොටගත් යුද හමුදා ස්වේච්ඡා බළසේනාවද පසුගිය දා විවිධ ඉසව් ඔස්සේ එලෙස දක්‍ෂතා පෙන්වූ ස්වේච්ඡා බළසේනා සාමාජික සාමාජිකාවන් අගයා සම්මාන ප්‍රදානයක් සිදුකිරීමට කටයුතු යොදා තිබුනේ ඒ පිළිබඳ යුද හමුදාව තුළ කිසියම් අවදියක් ඇති කරළමිනි. එබැවින් එය පූර්වාදර්ශයක් කොට ගනිමින් සුවිශේෂී දක්‍ෂතා වලින් පිරිපුන් ස්වේච්ඡා බළසේනා සාමාජික සාමාජිකාවන් හඳුනා ගෙන ඔවුනට ඒ ඔස්සේ ඉදිරියට යාමට හැකි පරිසරය නිර්මාණ කොට දී ඔවුනගේ හැකියාවන් යුද හමුදාවේ හා රටේ ප්‍රගමණය උදෙසා යොදා ගැනීමට ඉඩ වෙන්කරදීම සැමගේ වගකීමකි.

# රණවිරුවන් සතු සුවිශේෂ හැකියාවන් ඇගයුමට...

යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවට අයත් නිළධාරීන් හා සෙබලුන් සතු විශේෂ හැකියාවන් ඇගයීමට ලක්කෙරුණු “රණවිරු ප්‍රතිභා 2018” ඉකුත් ජුනි 01 දින මහරගම ජාතික තරුණ සේවා සභා පරිශ්‍රයේදී පැවැත්විණ. එහිදී කළා, සාහිත්‍ය, සෞන්දර්ය, තාක්‍ෂණ හා වෙනත් අංශ ඔස්සේ සිය හැකියාවන් විදහා පෑ රණවිරුවන් සඳහා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී ගේ සුරතින් සහතික හා සම්මාන ප්‍රදානය කෙරිණ.

එහිදී විශිෂ්ඨ කුසලතා, විශේෂ කුසලතා සහ කුසලතා යන කාණ්ඩ තුනක් යටතේ සම්මාන සහතික හිමිගැන්වූ අතර, ඒ වෙනුවෙන් පත් කළ විශේෂ මණ්ඩලයක් මගින් අදාල සුදුසුකම් ලැබූවන් තෝරා ගන්නා ලදී. සම්මාන ප්‍රදානොත්සවයට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි ඇතුළු ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ නිළධාරීහු හා සෙසු නිළයෝ විශාල පිරිසක් සහභාගී වූහ.

## විශිෂ්ඨ කුසලතා සඳහා සහතික හා සම්මාන ලබා ගනිමින්



සෙ/එස්101670 ලාන්ස් කෝප්‍රල් අයෝමි පෙරේරා (ගායනා අංශය) රණවිරු රියල්ස්ටාා II අධියර යටතේ එම තරඟාවලිය ජයග්‍රහනය කරමින් ගායිකාවක් ලෙස රටම හඳුනාගත් ඇය අදවන විට එම ක්ෂේත්‍රයේ බොහෝ දක්‍ෂතා පෙන්වා ඇති අයෙකි.



නි/3845 මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ (සාහිත්‍ය අංශය) ගීත රචනා, පද්‍ය රචනා, කෙටිකතා, ජයාරූප හා චිත්‍ර යන අංශ වලින් ජාතික මට්ටමේ සම්මාන 11 ක් දිනා ඇති ඔහු කාව්‍ය සංග්‍රහ ත්‍රිත්වයක්ද, කෙටිකතා සංග්‍රහයක්ද එළිදක්වා ඇත.

## විශේෂ කුසලතා සම්මාන ලබා



නි/2614 කර්නල් එම්පීපී පෙරේරා
(සාහිත්‍ය අංශය)
රණවරුණ සඟරාවේ විශේෂාංග ලේඛකයෙකු ලෙස ද කටයුතු කරන මෙම ජ්‍යෙෂ්ඨ නිළධාරි එම සඟරාවේ ආරම්භක සංස්කාරක ද වේ. කෙටි කතා, නවකතා, විචාර, ශාස්ත්‍රීය යන අංශ ගණනාවක් ඔස්සේ ඔහු තම ප්‍රතිභාව පළකොට තිබේ.



නි/3369 ලුතිතන් කර්නල්
ඩබ්ටීඑම්පීඑස් බණ්ඩාර ශ්‍රීලංසිරෙ
(ගායන අංශය)



නි/4170
මේජර් ඩීඩීසී වැලිකළ ජාශීබ
(ගායන අංශය)



සෙ/2එෆ්02354 ලාන්ස් කෝප්‍රල්
සුජීව කුමාර කේජීඑන් (සාහිත්‍ය අංශය)
නවකතා හා කෙටිකතා රචකයෙකු වන ඔහු කෘතීන් 03 ක් රචනාකොට ඇත. වෑ කඩවර නවකතාවට රාජ්‍ය සම්මාන නිර්දේශය, ගොඩගේ යෞවන සම්මාන හා ඌව පලාත් සාහිත්‍ය සම්මාන දිනා ඇත.



නි/5319 මේජර් ඩීආර්
තාරුකරත්න ශ්‍රීලංජාආබමු
(නිර්මාණ අංශය)



නි/4797 මේජර්
කේඩබ් දහනායක ශ්‍රීලංජාආබමු (නිවේදක අංශය)
නිවේදකයෙකු ලෙස ගෙවීගිය වසර ගණනාව පුරාම සිය දක්‍ෂතා පෙන්වා ඇති ඔහු අදවන විට යුද හමුදාව තුළ සිටින ප්‍රතිභාපූර්ණ නිවේදකයෙකු ලෙස විවිධ කටයුතු වලදී තම හඬ දායක කරමින් සිටි.



නි/3970 ලුතිතන් කර්නල්
එම්පීපී පීරිස් ජාශීබ
(නිර්මාණ අංශය)



සෙ/කියු108308 සා.සෙ.
සන්නස්ගල එස්කේ (මූර්ති අංශය)
මූර්ති ශිල්පියෙකු ලෙස විශිෂ්ඨ නිර්මාණ රැසක් බිහිකොට ඇති අයෙකි. යුද හමුදාවේ බොහෝ අංශ ආයතන වල මොහු අතින් නිමවුනු නිර්මාන දක ගත හැකි අතර, ඕනෑම තේමාවකට උචිත අයුරින් මූර්ති නිර්මාන කිරීමේ සහජ හැකියාව මොහු සතුය.



සෙ/ආර්100453
කාසෙ සේනානායක ඒඒඑස් (චිත්‍ර අංශය)
චිත්‍ර ශිල්පිනියක ලෙස විශිෂ්ඨ නිර්මාණ රැසක් බිහිකොට ඇති ඇය අතින් ඇඳුනු සිතුවම් යුද හමුදාවේ බොහෝ අංශ ආයතන වල දකගත හැකිය.

ඉතිරි කොටස 41 පිටුවට ☞



# අත්පන්දු හා දැල්පන්දු ශූරතාවලිය - 2018

## යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව

යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අන්තර් රෙජිමේන්තු වොලිබොල් හා නෙට්බෝල් තරඟාවලිය ඉකුත් මැයි මස 29 දින සිට ජුනි මස 01 දින දක්වා මහරගම ජාතික තරුණ සේවා සභා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. එහි සමාරම්භක උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි සහභාගි වූ අතර, එහි අවසන් දින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී එක්විය.



සිව් දිනක් පුරා පැවැත්වූ මෙම තරඟාවලියට පිරිමි කණ්ඩායම් 20 ක් හා කාන්තා කණ්ඩායම් 06 ක් වොලිබොල් ශූරතාවය සඳහාද, කාන්තා කණ්ඩායම් 05 ක් නෙට්බෝල් ශූරතාවය සඳහාද තරඟ වැදුනහ. එහිදී වොලිබෝල් පිරිමි ශූරතාවය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායමද අනුශූරතාවය ඉංජිනේරු සේවා රෙජිමේන්තු කණ්ඩායමද හිමිකර ගත්හ. එහි කාන්තා ශූරතාවය 6 (සෙව්) කාන්තා බළකායටද, අනුශූරතාවය ශ්‍රීලංකා යුද හමුදා පොදුසේවා බළකායටද හිමිවිය. 2018 ස්වේච්ඡා බළසේනා නෙට්බෝල් ශූරතාවය හිමිකර ගන්නා ලද්දේ 2 (සෙව්) කාන්තා බළකාය විසිනි. එහි අනුශූරතාවය දිනාගැනීමට 6 (සෙව්) කාන්තා බළකාය සමත්විය.





ස්වේච්ඡා බළසේනාවට අයත් ඒකක නියෝජනය කරන සියළු රෙජිමේන්තුවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් සංවිධානය කෙරුණු මෙම තරඟාවලිය අතිශය විචිත්‍රවූත් තරඟකාරීවූත් ඒකක් විය.











# හෙළ අසිරියයි.....
# අවුරුද්දයි








හෙළ ජන ක්‍රීඩාවන්ට මුල්තැන දෙමින් මෙවරත් ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ අති උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කෙරුණු බක්මහ උළෙලක් ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පසුගිය අප්‍රේල් මස 11 වන දින පැවැත්විණ.

මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි, හය කාර්ය සම්පාදන මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් කේජ්ඩීඑස්එල් පෙරේරා එල්එස්සී, ස්වේච්ඡා බළසේනා මූලස්ථාන මූලික මාණ්ඩලික නිළධාරි කේඩබ්ලිව්ආර් ද ආබ්‍රෙව් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිළධාරින් රැසක්ද ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ සේවයේ නියුතු නිළධාරි, සෙසු නිළයෝ හා ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක්ද සහභාගි වූහ.















ඡායාරූප - කෝප්‍රල් සාලිය බණ්ඩාර







# නොසැලෙන සවියෙන් නොනැවතී පෙරට

**ස්වේච්ඡා බළසේනා 137 වන සංවත්සරය**

**(1881.04.01 2018.04.01)**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 137 වෙනි සංවත්සරය 2018 අප්‍රේල් 01 දිනට යෙදී තිබුණි. දෙස බස රැස සුරැකීම උදෙසා වූ දීර්ඝ මෙහෙවරක නියැලි ස්වේච්ඡා බළසේනාව මෙවර සිය සංවත්සරය සමරනු ලැබුයේ යුද්ධ හමුදාවේ දෙවන විශාලතම ආයතනය ලෙසින් වන ආඩම්බරයද පෙරදැරිවය. ඒකක 100 කින් සැදි 65000 කට ආසන්න භට පිරිසකගෙන් සමන්විත ස්වේච්ඡා බළසේනාව අදවන විට යුද හමුදාව තුළ අතු පතර විහිදී ගිය දැවැන්ත වෘක්ෂයක් ලෙසින් සමස්ථ රටටම සෙවණ සලසමින් සිටී. නේකවිද හැලහැප්පීම්, දුෂ්කරතා, අභියෝග ජයගනිමින් නොසැලුණු ගමනක නියැලුණු ස්වේච්ඡා බළසේනාව කාලීන අවශ්‍යතා මැනවින් හඳුනාගනිමින් දේශය වෙනුවෙන් වූ අඛණ්ඩ මෙහෙවරක නියැලී සිටිති.

මෙවර යෙදුණු සංවත්සරය ආගමික කටයුතු වලට මුල් තැන දෙමින් සංවිධානය කෙරුණි. එහිදී පහත්ගම "සැඳෑ සෙවණ" වැඩිහිටි නිවාසය සුද්ද පවිත්‍ර කිරීම හා එහි වැඩිහිටි අයවළුන් හට දිවා ආහාරය පිරිනැමීමේ ප්‍රජා සත්කාරක වැඩ සටහන ද ප්‍රධාන විය. තවද සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී ගේ මූලිකත්වයෙන් මාර්තු 31 වන දින රාත්‍රියේ පැවැති සර්ව රාත්‍රික පිරිත් දේශණය ද, පසුදින සඟ සතු මහා දානමය පුණ්‍යකර්මය ද, සේනාවිධායක තුමා වෙත පිළිගැන්වූ සම්මාණ පෙළපාළියද, සියළු නිළ දිවා භෝජන සංග්‍රහයද මෙවර සංවත්සර උත්සව කටයුතු අතරට එක්ව තිබූ සෙසු අංගයන්ය.



# මව් රෙජිමේන්තුවෙන් බුහුමන්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එච් කස්තුරිආරච්චි නව නිළයට උසස් වීම නිමිත්තෙන් එම ජ්‍යෙෂ්ඨ නිළධාරි අයත් කාලතුවක්කු රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් ඉකුත් දා සම්මාන මුරයකින් හා සම්මාන පෙළපාලියකින් බුහුමන් පුදන ලදී. තවද සියලු නිළ දිවා භෝජන සංග්‍රහයකටද නියෝජ්‍ය සේනාවිධායක සහභාගි විය. එම අවස්ථාවට ශ්‍රීලකාහ රෙජිමේන්තු අධිපති ඇතුළු නිළධාරීහුද සෙසු නිළයෝ විශාල පිරිසක්ද සහභාගි වූහ.

### මව්බිමට නිබඳ ශක්තිය ගෙනෙන...

# යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා පුහුණු පාසල

## දියතලාව

දියතලාවේ පිහිටි යුද්ධ හමුදා ස්වේච්ඡා පුහුණු පාසල වූකලී එදාමෙදා තුර ස්වේච්ඡා බළසේනාවට පමණක් නොව සමස්ථ යුද්ධ හමුදාවටම අභිමානයක් ගෙනදුන් වසර සිය ගණනක ඉතිහාසයකට උරුකම් ඇති ඓතිහාසික පුහුණු පාසලකි. දැනුම, ආකල්ප, කුසලතා පිරි යුද හමුදා නිළධාරීන් හා සෙසුනිළයින් පුහුණු කරන තෝතැන්නක් වූ එමගින් වෘත්තීය දැනුමින් පොහොසත් දහස් සංඛ්‍යාත භඨපිරිසක් බිහිකොට ඇත.

ඉංග්‍රිසි පාලන සමයේ දී දකුණු අප්‍රිකානු බුවර් සිරකරුවන් රඳවා තබා ගැනීමට ඉදිකළ කඳවුරක් 1903 දී පමණ පැවැත්වූ පළමු වාර්ෂික පුහුණු කඳවුරින් පසුව යුද හමුදාවට වෘතීය නිළධාරින් සෙබළ සෙබළියන් බිහිකරන ප්‍රමුඛතම පුහුණු පාසලක් බවට පත්විණි. වත්මන වන විට යුද හමුදාවට අවැසි භට පිරිස් පුරුදු පුහුණු කීරීමට අමතරව සිවිල් රාජ්‍ය ආයතනයන්හි විවිධ අවශ්‍යතාවයන් අනුව වෙනත් කෙටි කාලීන පුහුණු කඳවුරුද එහි පැවැත්වේ. මෙවර රණවරුණ කලාපයේ ඒ අභිමානවත් ඉතිහාසයට උරුකම් කියන ස්වේච්ඡා බළසේනා පුහුණු පාසලෙහි පැවැත්වෙන විවිධ පාඨමාලා පිළිබඳ සැකෙවින් විවරනය කෙරේ.



ස්වේච්ඡා බළසේනාවට ඉඳුරාම බඳවාගත් විද්වත් වෘත්තික නිළධාරීන් උදෙසා පැවැති පුහුණු වැඩමුළුවේදී ස්වෙච්ඡා බළසේනා සේනාවිධායක ඇතුළු ස්වේච්ඡා පුහුණු පාසලේ කාර්ය මණ්ඩලය හා අදාල පාඨමාලාවේ නිළධාරීන් සමූහ ජායාරූපයකට පෙනී සිටිමින්.



ස්වේච්ඡා බළසේනා ජෝකොනොනීන් සඳහා
**par- excellence** පාඨමාලවක්



ස්වේච්ඡා බළසේනා නිළධාරින් සඳහා පැවත්වු
**par- excellence** පාඨමාලා අංක 15


සරඹ සංස්කරණ පුහුණු පාඨමාලා අංක 43


විද්වත් වෘත්තික කෙඩෙට් නිළධාරි පාඨමාලා අංක 38


බණ්ඩහාර සැරයන් පාඨමාලා අංක 58


ක්‍රියාශීලී පෙළ අණදෙන්නන්ගේ පාඨමාලා අංක 41


උපකරණ පාලක නිළධාරි පාඨමාලා අංක 18


ජ්‍යෙෂ්ඨ නිළධාරි සංස්කරණ පාඨමාලාව



සමෘද්ධි සංවර්ධන නිළධාරින් හට නායකත්වය
පිළිබඳ පුහුණු පාඨමාලාවක්


සෙසුනිළ ඉංග්‍රීසි පාඨමාලාව

# ඒකක තතු සොයා

## 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂ බළමුළුව



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) යටතේ ස්ථාපිත ස්වේච්ඡා ඒකකවල පාලන කටයුතු සොයා බැලීම පිණිස ස්වේච්ඡා බළසේනා මූලස්ථානය මගින් සිදු කළ පාලන පරීක්ෂාවක් ඉකුත් මැයි මස 9, 10 හා 11 යන දින වල පැවැත්විණ. ඊට සමගාමීව ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරි ආරච්චි විසින් එම බළ ප්‍රදේශයේ ස්ථාපිත 24 ශ්‍රීලංජාආබමු හි කඳවුරු සංචාරයකද නිරත විය.



## 17 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව

සිංහපුර වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගත 17 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකය වෙත 233 බළසේනාවේ බළසේනාධිපති කර්නල් කේජ් සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී පසුගියදා සංචාරයක නිරත විය.

# විවිධ පුවත්



### ආධ්‍යාත්මික සුව පතා ...

16 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු අණදෙන නිළධාරි මේජර් ඩීආර්එම්බී දිසානායක ගේ සංකල්පයක් මත ඒකක සාමාජිකයින්ගේ ආධ්‍යාත්මික ගුණාංග වැඩිදියුණු කිරීමේ අරමුණින් ඉදිකරන ලද බුද්ධ මන්දිරය පසුගියදා 24 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් නිරාවරණය කරන ලදී. මෙම අවස්ථාවට 241 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ඩබ්ලිව් චන්ද්‍රසිරි ආර්එස්පී යූඑස්පී පීඑස්සී ද එක්විය.





### සේවා වනිතා සත්කාරයක්

සේවා වනිතා පොදුසේවා බළකා ශාඛාවේ සභාපතිනි කමනි පලිහක්කාර ඇතුළු එම ශාඛාවේ සාමාජිකාවෝ ඉකුත් අප්‍රේල් මස 27 වන දින මුල්ලේරියාව රෝහලේ මානසික රෝගීන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා සංචාරයක නිරත වූහ. 2 ශ්‍රීලයුපොදුසේබ (සෙව්) ඒකකය වෙතින් සංවිධානය කරනු ලැබූ එම සංචාරයේදී එහි රෝගීන්හට දිවා ආහාරය පිරිනැමීම හා ඔවුන්ගේ ප්‍රයෝජනය පිණිස පරිත්‍යාග භාණ්ඩ බෙදාදීමක්ද සිදු කරන ලදී.

# කවි උල්පත

## අපේකම රැක නව ලොව සොයා යමු

සුන්දර මනහර ගතිගුණ සොඳිනේ
අමුණා ගත් මුතු මැණිකක් වැන්නේ
හිස මත පළඳා බොඳු දරුවන්නේ
නොනැසී ගුණදම් නිති රැකගන්නේ

මී මුත්තන් අපගේ ඒ කාලෙ පුතේ
ගුණදම් නිබඳ රැකගෙන හිටියාලු පොතේ
වැනසී යනවිටදී අද හැම මුහුණු පොතේ
බොඳවී යන්නෙ අපෙ කාගෙත් අනාගතේ

වංහුං සොයා යනවා මුළු ලෝකෙ වටේ
ඉතිහාසය එනමුත් නොදනී මෙරටේ
සාරධර්ම පොත්පත් ටික බිමට වැටේ
නූගත් කමෙන් දැන්නම් මරුවාගෙ කටේ

යලි යලි සිහනාද ලෝකයෙ පතුරන්න
ගුණදම් වලින් නිරතුරු සංවර වෙන්න
අපෙ දේ අතැර අන් දේවල් නොගනින්න
මඩේ පිපුන මුත් සුදු නෙළුමක් වෙන්න

සෙ/15එෆ්01068 සාසෙ අජිත් ප්‍රියන්ත
3(සෙව්) ගැහේබ

## පතිණියක කඳුළු

මතකය රිදුම් දේ සිහිවී මා බාලේ
තුරුළු කරන් ළමැදේ කල් ගෙවූ කාලේ
රුහිරු කිරට හැරවූ ඒ සෙනෙහෙ බලේ
ඒ සෙනෙහසයි මගෙ දිවියම එකළු කලේ

ඔබ ළමැදේ සුවවිඳි සුරතල් දියණී
අද දින නික්ම යයි කුලගෙට වී පතිණී
ඔහු සුරතින් අල්ලා මා පණ දෙවැනි
දියණිය රකිනු යැයි කිවේ හද සොවිනි

කඳුළු බර වැඩියි අම්මේ නෙතට මගේ
කවි පද නොමැත පබඳින්නට නුඹේ අගේ
හදතුළ කැකෑරෙන නුඹගේ සෙනේ ගගේ
කිමිදෙන්නට හිතයි පෙරලෙස මවුණි මගේ

සෙ/එල් 100034 සාසෙ ලක්දිනී එස්ඒඩී
වෛද්‍ය පරීක්ෂණාගාරය
ශ්‍රීලංයුහසෙව්බමු.

## දුම

කිමද මා
නුඹට පෙම් බැන්දේ
නුපුරුදු බව සුපුරුදු වී
නුඹ නැතුව බැරි විය......

නුඹ ලැබ ගත් මට
ලැබුනේ.......
ඇඳ සහ පිලිකාව

සෙ/2එල්00815
ලා/කෝ චතුර කුමාර පීජීඑන්
2 (සෙව්) ශ්‍රීලයුවෙබ
පනාගොඩ

## නුඹ.....

නුඹට කියූ අඳෝනා අතරේ
නුඹට ඇසුණු ඉකිගැසුම් අතරේ
නුඹට පෙනුණ කඳුලැල් අතරේ
නුඹට නැසුණු සුසුමන් බොහෝමයි
නුඹ නිසාවෙන් මසිත පතුලේ
තිබු ආලය සැබෑවයි

සෙ/එච්101058
සාසෙ වීරසිංහ එම්කේසී
16(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුව

## සෙනෙහස අපේ

වළාකුළ ඔබ
පවන් රොද මා
ඈත අහසේ
පාවෙනා...
රෝස මල නුඹ
දුර උයන් තෙර
තනිව ලෙලදෙන
සමනළයෙකි මා
ඔබ සිප ගන්නට
නොහැකිව ලතවෙන
සුමුදු සඳ ඔබ
පුංචි තරුව මම
ඈත අඳුරු ගුවන් ගැබේ
ළං වන්නට බැරි වෙලා

කර්නල් එම්පීජ්එන්බී මහතුවක්කාර
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී
කර්නල් ප්‍රධාන මාණ්ඩලික
යුද හමුදා ස්වේච්ඡා බලසේනා මුලස්ථානය.



සතුට සහ සාර්ථකත්වය සඳහා
ජීවිත කළමනාකරණ උපාය මාර්ග
26 වන කලාපය හා බැඳේ...

# සාර්ථකත්වයට මග

අපි හැමෝටම උවමනා කරන්නේ අපේ ජීවිත ඉතාමත්ම වේගයෙන් අපි අපේක්ෂා කරන දියුණු මට්ටමට ගෙන එන්නට. අවාසනාවකට අපි වැඩි දෙනෙක් දියුණුව සහ සාර්ථකත්වය අර්ථදක්වා ගන්නේ වැරදියටය. අපි දියුණුව කියලා අර්ථ දක්වන්නේ විශාල සුබෝපභෝගී මන්දිර, වාහන වගේ දෙවල් අයිති කරගැනීමට. එත් ජීවිත සාර්ථකත්වය කියන්නේ ඒවා අයිති කරගන්න එක නම් නෙවෙයි. මොකද? ජීවිතේ සාර්ථකත්වය කියන්නේ ඔය කියන සුබෝපභෝගීත්වය නම් ඕවා ඔක්කෝම කිසිම අඩුවක් නැතුව තියෙන මිනිස්සු හුඟාක් සතුටින් ඉන්න ඕන. එත් එදිනෙදා ජීවිතයේදී අපට මුණ ගැහෙන ඉතාමත් ධනවත් මිනිසුන් හැම කෙනෙක්ම එහෙම සතුටකින් ඉන්න බවක් පෙනෙන්න නෑ. ඒ හැමෝම එක්කෝ තව තවත් සාර්ථකත්වය අත්කරග න්න දරන අරගලය තුළ ඉතාමත් ආතතියකින් ඉන්න බවයි පෙනෙන්නට තියෙන්නෙ. ඒ විතරකුත් නොවෙයි විවිධ මාර්ගවලින් තව තවත් ධනය එකතු කරලන්න, නීති විරෝධි වැඩවල යෙදෙයි. සමහර කෝටිපතියෝ ඉන්නේ හිරගෙවල් වල.

මෑතකදී හමුදා සාමාජිකයින් කිහිප දෙනෙක්ම වඩ වඩා ධනය සෙවීමට නිති විරෝධි වැඩ කරලා ඒවා මාධ්‍ය මගින් වාර්තා කරලා තියෙනවා දැකලයි මේ කරුණු ටික ලියන්න හිතුවේ. ඒ වාර්ථා අතර මත්ද්‍රව්‍ය සමග අත්අඩංගුවට ගැනීම්, බැංකු කොල්ලකෑම්, ණය ගෙවාගැනීමට නොහැකිව සියදිවි

හානිකරගැනීමට අත්බෝම්බ රැගෙන යද්දී පිපිරීම් පවා සිද්ධ වෙලා තියෙනවා.

මෑත දවසක මා සමග මුහුණු පොත හරහා සම්බන්ධ වී සිටින හමුදා සාමාජිකයෙක් පහත සඳහන් කතාව මාහට පැවසුවාය.

මේ පුද්ගලයට පඩිය තිබිලා තියෙන්නේ 38000.00 යි. ඉතින් ඕකෙන් මාසෙට 24000.00ක් කැපෙන්න නිවාස ණයක් අරගෙන ලොකු ගෙයක් හදලා. කොහොම හරි ඉතිරි රු14000.00 කින් ඔහුගේ පවුල නඩත්තු කරමින් තමයි ඉඳලා තියෙන්නේ. ඉතින් අමාරුවෙන් ඔහොම ගත වෙද්දී දූනට අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා රු. 10000.00ක වැටුප් වැඩිවීම සිද්ධ වුනා. ඒ වැටුප් වැඩිවීමත් සමඟ මේ පුද්ගලයාගේ බිරිඳ ඔහුට කියලා අපි දූනුත් රු. 14000.00කින් නඩත්තු වුන නිසා ඔය වැඩිවුන රු. 10000.00 අතට අරගෙන ඕක වියදම් නොකර දියුණුවට යමක් කරමු කියලා. ඉතින් ඔහුත් ඒ උපදෙස් පිළිඅරන් තව රු.12000.00ක් මාසෙට කැපෙන්න ෆිනෑස් කරලා ත්‍රී වීල් එකක් අරගෙන එතකොට රු.48000.00න් 36000.00ක් ණයවලට කැපුනාම දූන් රු.12000.00යි දූන් අතට එන්නේ. දූන් ළමයිනුත් ලොකුයි. අමතර පන්තිවලට යවන්නත් ඕනිලු. සල්ලි මදී. ඉතින් මගෙන් අහනවා මොකද කරන්නෙ කියලා.

"ජීවිතය කියන්නේ තේරීමක්" ඒ කියන්නෙ මුළු ජීවිතේම සියළුම සිදුවීම් අවසන් සමුච්චිත එකතුව හෙවත් ඉරණම සම්පූර්ණයෙන්ම තීරණය වන්නේ ජීවිතයේ විවිධ සංධිස්ථාන වලදී අප විසින් කළ තේරීම් අනුවයි. ඉතින් ඔය කියන තේරීම්වල පදනම වන්නේ ජීවිතයේ ප්‍රමුඛතා මොනවාදැයි යන්න අප තීරණය කරන ආකාරයයි. අවාසනාවකට වගේ අපි ඔය ප්‍රමුඛතා පටලවා ගන්නව. ප්‍රමුඛතා කියලා කියන්නේම මුලින් කළයුතු වැඩි අවධානයක් යොමුවිය යුතු දේවල්. උදාහරණයක් ගත්තොත් දරුවන් ඉගෙන ගන්න කාලයේ ඔවුනට ලැබිය යුතු සම්පත් ලබාදීමයි. මොකද දරුවන්ට පාසල් යවන්නට තියෙන්නේ මුළු ජීවිත කාලෙන්ම අවුරුදු 13යි. ඉතින් ඒ කාලයේ දී අහිමිවන දේවල් නැවත ලබාගන්න හරි අමාරුයි.

එත් බොහෝ මිනිසුන් ජීවිතයේ ප්‍රමුඛතාවයන් දෙන්නේ සැබෑවටම ප්‍රමුඛතාවයන් ලැබිය යුතු දේවලට නම් නොවේ. මිනිස්සු වැඩිදෙනා ප්‍රමුඛතා හැටියට තෝරන්නේ තම තමාගේ සාර්ථකත්වය අනුන්ට ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍යවන දේවල් වලට. තේරෙන භාෂාවෙන් කිවහොත් රටට ගැම්ම පෙන්නන්න කරන දේවල් වලට. පුහු මමත්වය පුම්බාලන ප්‍රදර්ශනාත්මක දේවල් ප්‍රමුඛතා බවට පත්කර ගත්තම මුළු ජීවිතයම සංකීර්ණ වෙනවා විතරක් නොවෙයි අවුලෙන් අවුලට තමයි පත්වෙන්නේ. ඒ වගේ පුහු ආටෝප සමාජයට



පෙන්වන්න උත්සහ දරන අයට සිදුවන්නේ තමන් ඇතුලතින් බලවත් අසහනයකින් පෙලෙමින් සමාජය ඉදිරියේ ප්‍රදර්ශනාත්මක රංගනයක් ඉදිරිපත් කිරීම ම පමණයි.

මේ ලෝකෙට එන කිසි පුද්ගලයෙකුට තමන් සිතන පතන සියලු සම්පත් ලැබෙන්නේ නම් නැහැ. ඒක ලෝක යථාර්ථය. සාර්ථක ජීවිතයක් ගොඩනගා ගන්න නම් මේ ලෝකයේ ඇති සැටියෙන්ම තේරුම් ගන්න වෙනවා. මේ ලෝකයේ හැම මනුස්සයෙකුටම කිසියම් දේවල් වගයක් ලබාදෙනවා. තවත් දේවල් වගයක් අහිමි කරනවා. කාටවත් සිතන පතන සියළු සම්පත් නම් ලැබෙන්නෙ නම් නැහැ. දියුණු වෙන්න උත්සහ දරන අතරෙම මේ යථාර්ථය තේරුම් ගන්නත් අවශ්‍යයි. එහෙම තේරුම් අරගෙන ආකල්ප වෙනස් කරගත්තම සතුට හා ආත්ම තෘප්තිය නිතැතින්ම ලැබෙනවා.

තමනට දැනට ලැබිල තියෙන දේවල් වලින් සතුටට පත් නොවෙන අය මුළු ලෝකෙම ලැබුණත් සතුටු වෙන්නේ නෑ. දැන් මේකෙන් මම අදහස් කලේ දියුණු වෙන්න උත්සහ කරන්න එපා ලැබිල තියෙන දේ වලින් සතුටු වෙලා නිකන් ඉන්න කියන එක නෙවෙයි. තමන් දියුණුව කියලා අදහස් කරගෙන ඉන්න දේවල් යථාර්ථවාදී ද කියලා නැවත වරක් සිතා බලා නිවැරදි තීරණ අරන් නිවැරදි ඉලක්කයක් ඇතිකරගන්න කියලා මෙකෙන් අදහස් කරන්නෙ. යථාර්ථවාදී නොවන ආර්ථික ඉලක්ක තමයි ඔය මුල් පරිච්ඡේදවල සඳහන් කළ උදාහරණ වලින් කියපු අයගේ ජීවිත විනාශ කලේ. තෘප්තිමත් සතුටින් පිරුණු ජීවිත ගතකරන්නේ සියල්ලෙන් සම්පූර්ණ වෙච්ච ජීවිත ගත කරන අය නෙවෙයි. ජීවිතය යථාර්ථවාදීව අවබෝධ කරගන්න අයයි.

ජීවිතයේ සතුට ජීවිතය සාර්ථකත්වයට දැඩිලෙස බලපාන සාධකයක්. හැබැයි ජීවිතයේ සතුටට බලපාන ප්‍රධාන තීරණාත්මක සාධකය වන්නේ නම් නිවැරදි ආකල්පයි. මිනිස්සු වැඩිදෙනෙක්ම හිතාගෙන ඉන්නේ ජීවිතයේ සාර්ථකත්වය කියන්නෙම මුදල් ඉපයීම පමණමයි කියලා. ඉතින් ඒ වැරදි ආකල්පයෙන්, මහත් අසහනයකින් මුදල් ඉපයීමේ අරගලයේ ම යෙදිලා මිනිස්සු ලෙඩ වෙනවා. එහෙම වුනාම අර ඉපයූ මුදල් සියල්ලම ආපහු වියදම් කරන්න වෙනවා ලෙඩ සුවකරගන්න. ඒ නිසා කාලය විසින් පසුතැවිල්ලට ලක්කිරීමට පෙර ජීවිතය යථාර්ථවාදීව අවබෝධ කරගත හොත් පමණයි ජීවිතය සාර්ථකත්වය අත්කරගන්න පුලුවන් වෙන්නෙ.

මිනිසුන් හෙට දිනය සාර්ථක කරගැනීමේ අරමුණින් අද දවස ඉතාමත් අසහනකාරි ලෙස ගතකරයි .හෙට දිනය එළඹීමෙන් පසු අනිද්දා දිනය සාර්ථක කරගැනීමේ අරමුනින් තරග දිවිමේ ම යෙදෙයි. මෙසේ අනාගත සාර්ථකත්වය අරමුණින් වර්තමානය අසහනකාරි ලෙස ගෙවා දමයි. අප බලාපෙරෙත්තු වන එකී සාර්ථකත්වය කිසිදා නෙපැමිණේ. ඊට පෙරාතුව ජීවිතය අවසන් වේ. එබැවින් ජීවිතයේ ඉලක්ක හඹා යන අතර දැනට එළඹ ඇති මේ මෙහොතේදී ද ජීවිතය විඳීම අතපසු නෙකරන්න.

අපට මෙම මහපොළොව මත ජීවත් වීමට ඇති කාලසීමාව සීමා සහිතය.

අපට අපගේ ජීවිත කාලය කෙතරම් දැයි කිසිදු සහතිකයක්ද නොමැත.

ජීවත් වීමට ලැබෙන කාලය පිළබඳ කිසිම තැකීමකින් තොරව මෙලොවින් සමුගැනීමට අපට සිදුවනු ඇත.

එබැවින් මේ ජීවිත කාලය තුලදී ප්‍රයෝගිකව සම්පූර්ණ කලහැකි විශිෂ්ඨ පිවිත අරමුණු වෙනුවෙන් ජිවිත කැප කරන්න.

**ලුතිතන් කර්නල් චන්න කරුණාරත්න රශුප (විශ්‍රාමික)**
**ජීවිත මාර්ගෝපදේශන උපදේශක**



## ගේය පදරුත්

# විමසුම

# කිරුළ මුතු ලිහි



ඔවුහු අපමණ දේ කැප කළාහුය. තම දෑත, දෙපා, ඇස්, ඉස්, මස්, ලේ පමණක් නොව ඇට මිදුළු පවා ඒ වෙනුවෙන් කැප කළෝය. යන්තමට දෑත, දෙපා, දෙනෙත් යම් රිද්මයකට නතුකර ගැනීමට හැකි වූ දා සිට කාය ශක්තිය හීනවී අවයව අවසඟව යන තුරාම ඔවුහූ තම පාරම්පරික වගකීම මැනවින් ඉස්ට සිද්ධ කලාහුය. ඒ කුමක් අරභයාද...? මිළ මුදල්, යාන වාහන, ගේ දොර, වතු පිටි, හරක බාන ආදී භෞතික සම්පත් උදෙසාද...? නැතිනම් නිළය බලය ලබා ගැනීමේ පටු ආත්මාර්ථයන් පෙරදැරිවද...? එසේත් නොමැතිනම් හූදී ජන පහන් සංවේගය උදෙසාද...? සැබවින්ම ඔවුන්ගේ අරමුණ හූදී ජන පහන් සංවේගය හා නිරාමිස ආත්ම තෘප්තිය පමණක් යැයි මම කියමි. මන්ද ඔවුන්ගේ ජීවිතයේ සැඳෑ කාලය ගෙවන දුක්ඛිත ජීවිතය දෙස බැලීමේදී ඕනෑම දුහුනෙකුට එය වටහා ගත හැක. ඔවුහූ කවුරුන්ද...? වෙන කවුරුත් නොව, රුපියල් ශත මත උඩුකුරු වූ ජනසමාජයක තවමත් තමාගේ පරවේණි අයිතිය සුරකින මෙරට පාරම්පරික නර්ථන ශිල්පින් වේ.

ඔවුහූ කලෙක මහ වාසලට සේවය කලේය. සකල ශ්‍රී විරාජමාන, සිංහාසනාරූඪව වැඩ වාසය කරන්නා වූ රාජ රාජ මහාමාත්‍යාදීන් ගේ අලස අගාරික දෛනික ජීවන රටාවට සංතුෂ්ටිය ගෙන එනු වස් රඟමඬල මත අපමන දහඩිය මුගුරු හෙලුවෝය. ඒ නරපතීන්ගේ සුකුමාල බිසවුන්වහන්සේලාගේ භාවයන් උද්දීපනය වන අයුරින් රංගනයේ යෙදුනෝය. එපමණද?. නැත. රජ දුවාදරුවන් වෙනුවෙන්ද නැටුවෝය. එහෙත් ඔවුනට හිමිවුයේ කුමක්ද...? නින්ද ගමකි. එසේත් නැතිනම් බරසාර වදන් යොදූ නම්බු නාමයකි. අවසානයේ ශරිරය අවසඟව ගිය කල්හි ලෙලි ගැසූ රඹකැන් ගෙඩියක්

කිරුළ මුතු ලිහී සර සර හඬින් වැගිරෙනා
සුළු මැදුම් දෙතින පැටලී ගිගිරි වැලපෙනා
නටනවා නෙවෙයි වැහැරුණු දෙපා වෙව්ලනා
තන තන තාන තම් දෙනා
තන තන තාන තම් දෙනා

දිළිසෙනා සේම කරළිය දිලෙන්නේ නැති
වන්නමක් සේම සුමිහිරි තානමක් නැති
සකියණී ගිරෙන් ගිරට පැන යන්නට ජීවිතෙන් බැරි
සකියණී ගිරෙන් ගිරට පැන යන්නට ජීවිතෙන් බැරි

රඟ බිමෙන් බහින විට ගෙයි සන්තකව ඇති
නළල් පට මාල හත්පට සින්නවී ඇති
සකියණී රිදී කාසි සොලවන්නට බෙර පදය මදි
සකියණී රිදී කාසි සොලවන්නට බෙර පදය මදි...//



පද:
**රත්න ශ්‍රී විජේසිංහ**



හඬ:
**ජානක වික්‍රමසිංහ**



සත්සර:
**එච්.එම් ජයවර්ධන**

විමසුම :
**ලා/කෝ**
**සුජීව කුමාර කෝවිලතැන්න**

සේ ඔවුන් ඉවතට විසිවුනි. ඊට පසු ඔවුන්ගේම පරපුරේ අලුත් පිරිසකට එම තැන හිමිව ගියේය.

විටක ඔවුහු දෙවියන් වෙනුවෙන් ද නැටුවේය. එක දිගට දින දහය පහළොව අල්පේ ශාක්‍ය මහේශාඛ්‍ය දෙවි දේවතාවුන් වෙනුවෙන් තම කාය ශක්තිය දියකර හැරියේය. එහෙත් දෙවියන් දුන් දෙයක් තවමත් සොයාගත නොහැක. තවත් විටෙක ඔවුහු බුදුන්වහන්සේ වෙනුවෙන්ද නර්ථනයේ යොදවුවෝය. කුමාර අවධියේ තම මාළිගයේ උන් රාජකීය නාට්‍යාංගනාවන්ගේ විසුලු විකාර රූපී නිදි ඉරියව් ද සත්‍ය සොයා යෑමට එක් හේතුවක් කොටගත් උන්වහන්සේට ඒ පෘතග්ජනයන් නටන නැටුමෙන් ඇති ඵලය කුමක්ද...?

ඔවුහු අතීතයේදී පවා නැටූහ. වර්තමානයේ පවා නටන්නේය. අනාගතයේදී ද ඔවුන් හට නටන්නට සිදුවන්නේය. මන්ද ඔවුන්ගේ මුලු ජීවිතයම නර්ථනය වන නිසාවෙනි.

සමාවනු මැන. ඉහත පූර්විකා මා ලියුවේ මෙවර ''ගේයපදයක පදරුත්'' විමසීමට ඉඩහසර පාදගනු පිණිසය.

''**කිරුළ මුතු ලිහි සර සර හඬින් වැගිරෙනා**''

කිරුළ වූ කළි රාජකීය සංකේතයයි. එය සැමට හිසලා ගැනීමට අවකාශයක් නැත. ඒ සඳහා පාරම්පරික උරුමයක් තිබිය යුතුය. අතීතයේ තතු එලෙස විය. වත්මනේ ද එහි වෙනසක් නැත. වෙනසකට ඇත්තේ භාවිතා කරන ක්‍රමෝපායන්වල, හැඩතල ආදියේ වෙනස පමණි. රූප රාජිණී තරඟ යන්හිදී ද, බක්මහ උත්සවවලදී ද, කාන්තා පක්ෂය නියෝජනය කරන සමහර ක්‍රීඩා ඉසව්වලදී ද කිරුළ හිමිකර ගන්නෝ සිටිති. එහෙත් පලක් නැත. මන්ද එහි රාජ උෂ්ණය තැවරී නොමැත. මොවුන් අතුරින් තම පරවේණි උරුමය නිසාම කිරුළ පළඳින්නෝ ද සිටිති. සැබවින්ම එය කිරුලක්, ඔටුන්නක් නොව හිස් පළඳනාවකි. හිස් පළඳානවාක් වූවත් ඔවුනට එය ඔටුන්නකි. එහි යම් සමාජ වටිනාකමක් ද ඇත. මන්ද ඒ ඔවුන්ගේ අනන්‍යතාවය මෙමගින් කියාපාන බැවිනි.

ඔවුහු වෙන කිසිවෙකුත් නොව මා ඉහත සඳහන් කළ සම්ප්‍රදායික නර්ථන ශිල්පීන්ය. මෙහි එන කතානායකයාද එවන් ශිල්පියෙකි. ඒ ගමේ ගොඩේ නර්ථන ශිල්පියෙක් නොවන්නේය. ඔහු දුරාතීතයේ සිට රාජකීය නම්බු නාම ලැබූ පරපුරකින් පැවත එන්නෙකි. තව ඔහුද රාජකීය සම්මානයට පාත්‍ර වූවෙකි. ඔහුගේ හිසේද කිරුළක් පළඳා තිබේ. එහි මුතු ඔබ්බවා ඇති බවද පවසති. අවාසනාවක මහත ඒ මුතු ලිහී සර සර හඬින් වැගීරී යන්නේය. එපමණද?. නැත. දෙතිත පැටලී පයලූ ගිගිරි වැලපේ. දෙතිත වූ කලී උඩරට බෙරයේ දෙපස වේ. එය සුළු පිරිමැදීමකින් වූවත් මහ හඬක් නංවයි. ඔහුට වම්පස දකුණු පස දෙතිත පැටලී තිබේ. ඒ නිසාම නඟන හඬ ද අම්හිරිය. තාලයක් රිද්මයක් නැත. පද වැරදී ගිය කළ එය දෙපයට ද දැනේ. මන්ද නර්තන ශිල්පියා පාදය තබා රිද්මය ගනු ලබන්නේ බෙර පදයේ හඬටය. එය වැරදී ගිය කළ පයලූ ගිගිරි නගන හඬද ශෝක ජනකය. පිළිවෙලක් නැත. එය ශෝකී වැලපිල්ලක් බඳුය. ශෝකී වැළපිල්ලකට රිද්මයක් තාලයක් නැත. තම භාවයන් උද්දීපනය වන, ආශ්වාස ප්‍රාශ්වාස කරන කාලය හා පරාසය අනුව එයට තාලයක් රිද්මයක් ගත නොහැක්කේය. (අවංකව වැලපෙන හඬන අයට පමණි) ''නටනවා නොවෙයි වැහැරුණු දෙපා සොලවනා'' සැබවින්ම මෙය නර්ථනයක් නොවේ. කාය ශක්තිය හීනවී ගිය දුබල නැට්ටුක්කරුවෙකුගේ අවසඟ දෙපා සෙලවීමකි. මුල් පද පෙල ගැස්ම තුළ මතුපිට අර්ථය එයයි. එහෙත් ඊට එහා ගිය ශෝකජනක කතන්දරයක් මෙහි සැඟව ඇත. එය මෙම ගීතයේ ප්‍රභවය පිළිබඳ සනිටුහන් කරන තැන සඳහන් කරන්නෙමි. සැබවින්ම ලාංකීය සම්ප්‍රදායික නර්තන ශිල්පින්ගේ ජීවිත ඛේදාන්තය මෙම ගීතය තුළ සිතුවම් කොට තිබේ.

**''දෙතිත වූ කලී උඩරට බෙරයේ දෙපස වේ. එය සුළු පිරිමැදීමකින් වූවත් මහ හඬක් නංවයි. ඔහුට වම්පස දකුණු පස දෙතිත පැටලී තිබේ. ඒ නිසාම නඟන හඬ ද අම්හිරිය. තාලයක් රිද්මයක් නැත. පද වැරදී ගිය කළ එය දෙපයට ද දැනේ. මන්ද නර්තන ශිල්පියා පාදය තබා රිද්මය ගනු ලබන්නේ බෙර පදයේ හඬටය.''**

තවද මෙම පදපෙළ තුළින් හා ගීතය පුරාවට බොදු දහමේ සදාතනික පණිවුඩය ද සඟවා ඇතැයි උපකල්පනය කළ හැකිය. සංසාරය පිළිබඳ සැබෑ කියවීමක් මෙමඟින් දැකිය හැකිය. මන්ද බොහෝ මිනිසුන් නිළය බලය ඇති දා ජීවත්වන්නේ නොමියන මිනිසුන් ලෙසය. එහෙත් කාය ශක්තිය හීනවී ගියා දා කාගේ හෝ හව්හරණක් ලැබ හෝ නොලබැ මිය යන්නේය. කිරළ වූ තාවකාලීක බව කවුරු කවුරුත් දැනගත යුතු බව මෙමගින් කියා නොපාන්නේද?



''කරළිය වූ කලි අනේක විඳි වර්ණයන්ගෙන් සුසැදි බිමකි. එහි නේක නේක වර්ණ පහන් දල්වා තිබේ. වෛවර්ණ තිර රෙදි ඇද ඇත. නොයෙකුත් කැටයම් මූර්ති මගින් අලංකාරවත් කර තිබේ. සැබවින්ම එහි මිහිබට සුර පුරයක් තරමට සරසා ඇත. එහෙත් ඒ කරළිය මත රංගනයේ යෙදෙන මානව මානවිකාවන්ගේ ජීවිත රංගනය ඒ තරම් සුදිලේද?. ,,

**දිළිසෙනා සේම කරළිය දිලෙන්නේ නැති**

**වන්නමක් සේම සුමිහිරි තානමක් නැති**

**සකියණී ගිරෙන් ගිරට පැන යන්නට ජීවිතෙන් බැරි**

කරළිය වූ කලී අනේක විඳි වර්ණයන්ගෙන් සුසැදි බිමකි. එහි නේක නේක වර්ණ පහන් දල්වා තිබේ. වෛවර්ණ තිර රෙදි ඇද ඇත. නොයෙකුත් කැටයම් මූර්ති මගින් අලංකාරවත් කර තිබේ. සැබවින්ම එහි මිහිබට සුරපුරයක් තරමට සරසා ඇත. එහෙත් ඒ කරළිය මත රංගනයේ යෙදෙන මානව මානවිකාවන්ගේ ජීවිත රංගනය ඒ තරම් සුදිලේද?. නටන නැටුම් තරම් ජව සම්පන්නද? ගී පද රචකයා ඔවුනගේ ජීවිත ඇතුලාන්තය අපට පසක් කරවන සැටි අපූරුය. හෙළ නර්ථන කලාවේ වන්නම් දහ අටකි. එවා එකිනෙක පරදන තරමට සෝබනය. අලංකාරය. ජව සම්පන්නය. එහෙත් ඒ වන්නම් නටන නර්තන ශීල්පියාගේ ජීවිත වන්නම කොතරම් සොඳුරුද?.. ''**වන්නමක් සේම සුමිහිරි තානමක් නැති**'' ගී පද රචකයා දල්වන ආලෝකය ප්‍රබලය. අපට පසක් කරවන සත්‍යය කොතරම් කටුකද?

''**සකියණී ගිරෙන් ගිරට පැන යන්නට ජීවිතෙන් බැරි**'' මෙය අපූරු උපමාවකි. ගිර වූ කලී කන්දකි. කන්දකින් පැන තවත් කන්දක් තරණය කිරීමට ඔවුනට වරම් නැත. ඔවුනට ජීවිතයෙන් පලා යැමට නොහැක. කන්දක් අතහැර තවත් කන්දක් නැගීමට තරම් වත්කම් ඔවුන් සන්තකයේ නැත. ඇති එකම වත්කම තමා දැන උගත් නර්ථන ශිල්පය පමණී. ඒ හැර ඔවුනට වෙනත් විකල්පයක් නැත. නමුදු ජීවිතයෙන් පලායැමට ද නොහැක. ඔවුන්ද ජීවිතයට ආශා කරන්නෝය.

රඟ බිමෙන් බහින විට ගෙයි සන්තකව ඇති
නළල් පට මාල හත්පට සින්නවී ඇති
සකියණී රිදී කාසි සොලවන්නට බෙර පදය මදි

මෙය පාරම්පරික නර්ථන ශිල්පියාගේ සැබෑ ජීවිතයයි. රජුන් දෙවියන් වෙනුවෙන් නටා ඔවුන් ඉතිරි කරගත් දෙයක් නැත. බඩගෝස්තරවාදි දේශපාලනය ද කර නොමැත. කොමිස් ගසා සොයාගත් මිළ මුදලක් ද නැත්තේය. ඇත්තේ පරම්පරාවෙන් පරම්පරාවට ලැබූ නර්ථන ආභාෂයත් ඒ වෙනුවෙන් ලැබූ සුළු සුළු පඬුරු පඩුක්කම් ටිකක් පමණී. සමහර විට ඒවා නර්තන ඇඳුම් ආයිත්තම් වලට පමණක් සීමා විය හැකිය. අප කතානායකයා මේ වන විට එම ආයිත්තම් ද උගසට තබා ඇති බව සිතිය යුතුය. ''සකියණී රිදී කාසි සොලවන්නට බෙර පදය මදි'' සැබවින්ම ඔවුනගේ පාරම්පරික නර්ථනයෙන් අද වැඩක් නැත. ඊට එහා ගිය විසූක දස්සන ඕනෑ තරම් තිබේ. නැබ, ඉඟ, සුඟ, කලවා, දෙතන පමණක් නොව ශරීරයේ නොපෙන්විය යුතු තැන් පෙන්වමින් වේදිකා මත දඟලන නර්තන ශිල්පිණියෝ ඕනෑ තරම් ඇත. එවාට යම් මිලක්ද වටිනාකමක් ද ඇත. එහෙත් සංවර ඇඳුමකින් ගත වසාගෙන දෙවියන් බුදුන්





වෙනුවෙන් පවා නර්තනයේ යෙදෙන මෙම පූජනීය මිනිසුන්ගේ නර්ථන වින්‍යාසය වත්මන් සමාජයට නොහොබින්නේය. ඒ නිසාම ඔවුන්ගෙන් වැඩක් ගනු ලබන්නේ පෙරහැරකදී පමණි. නැතිනම් රාජකීය උත්සව අවස්ථාවලදී සංවිධායකයින්ගේ තේජස පෙන්වීමට පමණි. ඉතින් ''සකියණි රිදී කාසි සොලවන්නට බෙර පදය මදි'' වීම අරුමයක් විය නොහැක.

මේ එක් සම්ප්‍රදායික නර්තන ශිල්පියෙකුගේ ජීවන කතන්දරය වේ. එය ඔවුන්ගේ සමස්ථ ප්‍රජවේම සත්‍ය කතන්දරයයි. මෙය නර්ථනයට පමණක් සීමාවී නොමැත. වත්මන් ලාංකීය චූල වංශයේ සියලු කලාවෝ අත්පත් කරගෙන ඇති සමාජ ඛේදවාචකය මෙයයි. සැබෑ මානවවාදී කලාකරුවන්ගේ ජීවිතයේ සැබෑ කතන්දරය මෙයයි.

ඕනෑම කලා නිර්මාණයක් යනු සමාජ නිශ්පාදනයකි. කවිය, කෙටි කතාව, නවකතාව, සිනමාව, වේදිකාව ආදී නන් වැදෑරුම් කලාවන් මෙම සමාජ නිශ්පාදන ගොන්නට අයත්ය. කලාකරුවා පුද්ගලිකව හෝ සමාජමය වශයෙන් ලබන අත්දැකීම තමන් කැමති මාධ්‍යයක් හරහා එළිදැක්වීම නිර්මාණකරණය ලෙස සරලව අර්ථ කතනය කළහොත් මෙම ගීතයේ ප්‍රභවයද අපූරුය. ගේයපදකරු කිව්වර රතන ශ්‍රී විජේසිංහයන් මා හා දුරකතනයෙන් පැවසූ ඒ  කතන්දරයද මෙහි සටහන්කර තබමි. ඔහු පවසනයුරු ඒ අසූව දශකයේ අවසන් භාගය වීය. එකල රජ්‍ය අනුග්‍රහය ඇතිව පාරම්පරික වයෝවෘද්ධ නර්තන ශිල්පින්ට උපහාර පිදීමේ උළෙලක් කොළඹ සුදර්ශී ශාලාවේ පවත්වා තිබේ. අප ගේයපද රචකයා මෙම උපහාර උළලේ උපහාර ගීතය ලියූ නිසා ඔහුටද ආරාධනාවක් ලැබී ඇත. කෙලෙසක හෝ දුටුවන්ගේ දෙනෙත්වලට කඳුළු පුරවමින් වයෝවෘද්ධ නර්තන ශිල්පීන්ට සම්මාන උපාහාර මදි නොකියන්නට පුදන්නට එදින සංවිධායකයෝ කටයුතු යොදා තිබුනේය. ජීවිතයේ පළමු වතාවට එලෙස උපහාර හිමිවූ ශිල්පීන් ද ඒ අතර විය. කෙලෙසක හෝ උපහාර උළෙල අවසන් වීය. අප ගීපද රචකයා ඒ මොහොතේ වට වැස්සද නොතකා සුදර්ශියෙන් පිටව බොරැල්ල දෙසට එමින් සිටියේය. ඔහු දුටු දසුනින් වික්ශිප්ත විය. ඊට හෝරාවකට හමාරකට පෙර සම්මාන උළෙලේ වටිනාම සම්මානය හිමිකර ගත් ප්‍රවින වයෝවෘද්ධ නර්තන ශිල්පියා සුදර්ශිය ඉදිරිපිට නුග ගස පාමුල තෙමෙමින් උන්නේය. ඔහුට ඉහළ ගැනීමට කුඩයක් ද නැත. වයසට නොගැලපෙන තරමට බර වැඩී සම්මානය කිහිල්ලේ හොවාගෙන අධික සීතලින් හා වට වැස්සෙන් බරිතව උන්නේය. සම්මාන පිදුවෝ අති සුඛෝපභෝගී මෝටර් රියවල නැගී මහ මඟ ද සුද්ධ කරගෙන ඉගිල ගියේය. ගේය පදකරු මහත් කම්පනයට පත්විය. ඔහු කියන පරිදි ලංකාවේ තවත් ප්‍රවින නර්තන ශිල්පියෙක් මිය ගියේ කුප්පි ලාම්පුව පෙරලිලාය. අද උස්සපෙල සිසුන් සඳහා නර්තන කලා විෂය පතය තුළට ඔහු පිළිබඳවද ඇතුළත් කොට තිබේ.  නමුත් ඔහු මිය ගියේ කුප්පි ලාම්පුව පෙරලීලා නම් කොතනක හෝ වරදක් ඇත. අප ඒ වරද සොයාගත යුතුය. එය සමස්ථ සමාජයටම පැවැරුණු වගකීමක් නොවන්නේ?.




# කෙළි බිමෙහි පෙන්නු විරු දිරි හපන්කම්...

## ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලිය 2018



යුද හමුදා ස්වේච්ඡා බළසේනාව වාර්ෂිකව සංවිධානය කරන දැවැන්තම ක්‍රීඩා සැණකෙළිය වන “ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලිය - 2018” ඉකුත් පෙබරවාරි මස 20 වන දින සිට 22 වන දින දක්වා දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. එහි සමාරම්භක උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී එක්ව්ය. අති උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කෙරුණ එම තරඟාවලියට යුද හමුදා ස්වේච්ඡා ඒකක අයත් සියළු රෙජිමේන්තු නියෝජනය කරමින් ක්‍රීඩා කණ්ඩායම් සහභාගී වූහ. දින තුනක් පුරා පැවති මෙම තරඟාවලියෙහි අවසන් දින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී යූඑස්ඒසීපීඑස්සී එක්ව්ය. දෙස් විදෙස් කෙළි බිම රනින් බැබළවූ අති දක්ෂ ක්‍රීඩා තරු රැසකට පාර කියූ ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලිය වූ කලී ජව බළ සපිරි ස්වේච්ඡා විරුවන්ගේ අභිමානයේ තෝතැන්නයි.





















# ජන සෙත සදමින්

## මනුෂ්‍යත්වයේ නාමයෙන් අත්වැල් බැඳ ගනී



3(සෙව්) ශ්‍රී ලංකා යුද හමුදා කාන්තා බළකා අණදෙන නිළධාරිනී මේජර් චමරි විජේතිලක ගේ මගපෙන්වීම මත පසුගියදා පොළොන්නරුව පුලතිසිපුර පැරකුම් ළමා හා වැඩිහිටි නිවාසයේ නේවාසිකයින් වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වා ත්‍යාග බෙදාදීමක් සිදුකරන ලදී. 70 වන නිදහස් දිනයට සමගාමීව පැවති මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස නැගෙනහිර ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ඩබ්ලිව්එස්ඩීබී පනන්වල ආර්එස්පී එන්ඩීයු ඇතුලු ජ්‍යෙෂ්ඨ නිධාරිහූ රැසක්ද මහා සංඝ රත්නයද එක්වූහ. එදින එම නේවාසිකයින්ගේ මානසික සන්තෘෂ්ඨිය සඳහා සංගීත සන්ධ්‍යාවක්ද පවත්වන ලදී.

## බක්මහේ සුහදත්වය





කොඩිකාමම් ප්‍රදේශයේ ස්ථානගත 15 (සෙව්) ගජබා රෙජිමේන්තු අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් ඩබ්ලිව්ඩීආර්ජේ කරුණාරත්න ගේ අදහසකට අනුව පසුගියදා එම මූලස්ථානයේ දි බක්මහ උළෙලක් පවත්වන ලදි. යුද හමුදා සහ සිවිල් ජනතාව අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් පැවත්වූ මෙම බක්මහ උළෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 522 බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් එම්ආර්කේඩබ්ලිව්ඩීබී පින්නවල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී සහභාගී විය.

## හෙට දිනට ආයෝජනයක් ...



70 වැනි නිදහස් සමරුවට සමගාමිව 13 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළු වැ.බ. අණදෙන නිළධාරි මේජර් ආර්එම්බී හේරත් ශ්‍රීලංජාආබමු ගේ මග පෙන්වීම මත පසුගියදා මුතියන්කාඩු ප්‍රදේශවාසීන් වෙත කොස් පැල හා සියඹලා පැල බෙදාදීමක් සිදුකරන ලදී.

## රුහිරු බිඳු දන්දෙමින් ...



කන්කසන්තුරය ප්‍රදේශයේ ස්ථානගත 18(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සිය 10වන සංවත්සරය පසුගියදා වැ.බ. අණදෙන නිලධාරි මේජර් ඒඑම්එම්බී අත්තනායක ශ්‍රීලංසිරෙ ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් අයුරින් සමරන ලදී. එහිදී ප්‍රජාසත්කාරක සේවාවන්ට මුල්තැනක් දෙමින් වැඩසටහන් රාශියක් සංවිධානය කෙරුණු අතර, ඉන් ලේ දන් දීමේ කටයුත්ත ප්‍රධාන තැනක් ඉසිලීය.

## දිවි නැගුමට අත්වැලක්.....



17 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව පසුගියදා සිය දසවන සංවත්සරය සැමරීය. ඒ නිමිත්තෙන් සිංහපුර, වැලිකන්ද ප්‍රදේශයේ ප්‍රජා සත්කාර රැසක් ක්‍රියාවට නංවන ලදී. එහිදී පොළොන්නරුව රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව පවත්වන ලද ලේ දන් දීමේ වැඩසටහන හා ප්‍රදේශයේ ජීවත්වන සිංහල, දෙමළ, හා මුස්ලිම් පවුල් වෙනුවෙන් කජු පැල බෙදාදීම මුල් තැනක් ගත්තේය.

# ජන සෙත සදමින්

## මග පිළිසකර කරමින් ...



පෙරියවඩ්ඩුවාන් තොප්පිගල ප්‍රදේශයේ ස්ථානගත 12 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව විසින් පසුගියදා කිරාන් සිට පුලිපංචිකල් දක්වා සහ එම මාර්ගයේ 5 කණුවේ සිට තාරවිකුලම් දක්වා මාර්ගය අලුත්වැඩියා කරන ලදී. 232 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ජේඑම්ආර්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී ගේ උපදෙස් මත කෝරලේපත්තු (දකුණ) ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් සිදුකළ මෙම සත්කාර්යය 12ශ්‍රීලංජාආබමු අණදෙන නිලධාරි මේජර් එන්ඩබ්ලිව් දහනායක ශ්‍රීලංජාආබමු ගේ අධීක්‍ෂණය යටතේ සිදුකෙරුණි. මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම මගින් ප්‍රදේශයේ 15000 කට අධික ජනතාවට අත්වූ සෙත අපමණය.

## අධ්‍යාත්මික සුව පතා



අම්පාර මහාවාපී විහාරස්ථාන බෝධිය වටා ඉංජිනේරු බළකා හා 16 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළු සෙබලුන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ වලාකුළු බැම්ම පසුගියදා 24 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් නිරාවරණය කරන ලදි. 24 වන සේනාංකයේ සේනාංකාධිපති ගේ පූර්ණ මගපෙන්වීම මත අදාළ වලාකුළු බැම්ම ඉදිකිරීම් කටයුතු සිදුකෙරුණි. මෙම අවස්ථාවට මහා සංඝරත්නය ඇතුළු යුද හමුදා සාමාජිකයෝ රැසක් ද ගම්වාසීහු විශාල පිරිසක් ද එක්වූහ.

## පරිසර මිතුරෝ ...



නුවරඑළිය "වසන්ත සැණකෙළියට" සමගාමීව නුවරඑළිය මහ නගර සභාව, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන එක්ව සංවිධානය කරන ලද පරිසර මිතුරු වසන්ත සමය වැඩසටහන සඳහා මෙවරත් 3(සෙව්) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සමාජිකයෝ එක්වූහ. පරිසර හානියට තුඩුදෙන ඉවත ලන ප්ලාස්ටික් ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීම ආදිය සිදුකළ මෙම ප්‍රජාසත්කාරය සඳහා 3(සෙව්) ශ්‍රීලංසිරෙ අණදෙන නිලධාරි මේජර් ඩබ්ලිව්ජ්ජ්ම් රණතිලක ඇතුළු ඒකක සාමාජිකයන් රැසක් එක්විය.

නුවරඑළිය ග්‍රෙගරිවැව ආශ්‍රිතව සිදු කළ මෙම උදාර කටයුත්ත සඳහා නාවික හමුදාව, පොලිසිය නුවරඑළිය මහ නගර සභා සාමාජිකයෝ හා ප්‍රදේශවාසීහු විශාල පිරිසක්ද සහභාගී වුහ.

## අධ්‍යාත්මික සුව පතා



තොප්පිගල ප්‍රදේශයේ ස්ථානගත 12 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව විසින් පසුගියදා ප්‍රජාසත්කාරක වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. වැ.බ. අණදෙන නිළධාරි මේජර් එන්ඩබ්ලිව් දහනායකගේ උපදෙස් මත මඩකලපුව එරාවුර්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙරියවඩ්ඩුවාන් පාසල් භූමිය, මුරුතාන මුරුගන්තිව් විද්‍යාලය හා එහි පුල්ලෙයාර් කෝවිල පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් පවත්වන ලදී. තවද පෙරිල්ලාවේලි ග්‍රාම නිළධාරි කොට්ඨාශයේ පුලිපයින්දකල් විද්‍යාලයේ පාසල් සිසුන්ගේ කොණ්ඩා කැපීමේ ප්‍රජාසත්කාරයක් ද සිදුකරන්නට යෙදුණි.

## දන්සල



පසුගිය වෙසක් පුර පසලොස්වක පොහෝ දිනය නිමිතිකොටගෙන ගම්පොළ ප්‍රදේශවාසීන් උදෙසා 2 වන ශ්‍රී ලංකා රයිෆල් බළකා වැ.බ. අණදෙන නිළධාරි මේජර් ඩබ්එම්කේ වීරවර්ධන ශ්‍රීලංරබ ගේ මග පෙන්වීම හා පූර්ණ අධීක්‍ෂණය යටතේ ඒකක නිළධාරි/සෙසුනිළයින්ගේ දායකත්වයෙන් දිවා ආහාර දන්සැලක් එම කඳවුරු පරිශ්‍රයේදී පවත්වන ලදී. එම දන්සැල විවෘත කිරීමේ අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 111 බළසේනාධිපති කර්නල් ඩබ්ලිව්බීඩබ්ලිව්එම්ආර්එස්පී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය.

# කෙළිබිම ජයගෙන

## වොලිබෝල් ශූරයෝ...




නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති
මේජර් ජෙනරල් එච්ඩබ්ලිව්එස්ඩීබී පනන්වල ආර්එස්පී එන්ඩීයු
සමග ජයග්‍රාහී
වොලිබෝල් කණ්ඩායම



ජයග්‍රාහී වොලිබෝල් කණ්ඩායම නියෝජනය කළ
5(සෙව්) ශ්‍රීලකාහ ඒකකයට අයත් ක්‍රීඩකයෝ
තම ඒකක වැ.බ. අණදෙන නිලධාරි
මේජර් ටීවීආර් පෙරේරා ආර්එස්පී හා දෙවන අණදෙන නිලධාරි
මේජර් එන්වීවයිඑම් නාවිමන සමඟ

## පැසි පන්දු ශූරයෝ...



නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපතිගේ සංකල්පයකට අනුව අන්තර් සේනාංක අත් පන්දු හා පැසි පන්දු තරඟාවලියක් පසුගියදා පැවැත්විණ. නැගෙනහිර ආරක්ෂක සේනා බලප්‍රදේශයේ සේවයේ නියුතු හමුදා සාමාජිකයින්ගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීමටත් ඒ තුළින් ජාතික මට්ටමේ ක්‍රීඩකයින් බිහිකිරීමත්, හමුදා සාමාජිකයින් තුළ සුහදතාව වර්ධනය කිරීමත් මෙම තරඟාවලිය පැවැත්වීමේ අරමුණ විය. ආසේමු (නැ) කණ්ඩායම පරදා 22 වන සේනාංක කණ්ඩායම, එහි දී අත්පන්දු තරඟාවලියේ ජයග්‍රහනයද පැසි පන්දු තරඟාවලියේ ජයග්‍රහණය 22 වන සේනාංක කණ්ඩායම පරදා 24 වන සේනාංක කණ්ඩායම ද හිමිකර ගත්හ. ආසේමු (නැ) ආඥාපති මේජර් ජෙනරල් එච්ඩබ්ලිව්එස්ඩීබී පනන්වල ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම තරඟාවලියට 22,23,24 සේනාංකාධිපතිවරු ද, ඉනපෙ (නැ) ආඥාපති ඇතුළු නිළධාරිහු සහ සෙසුනිළයෝ රැසක්ද එක්වුහ.

## කබඩි ශූරයෝ



යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත සේනාංක, බලසේනා හා ඒකක අතර පැවති කබඩි තරඟාවලියේ 4 විජයබාහු පාබල රෙජිමේන්තු කණ්ඩායම පරදවා සමස්ථ ශූරතාවය දිනා ගැනීමට 20 බළඇණිය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සමත් විය. නිත්‍ය හා ස්වේච්ඡා කණ්ඩායම් 32ක් සහභාගී වූ මෙම තරඟාවලියේ අවසන් මහා තරඟය යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩීඩීයූකේ හෙට්ටිආරච්චි ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

## කරාතේ ශූරයෝ



පසුගිය පෙබරවාරි මස 26,27 සහ 28 යන දිනයන්හි අනුරාධපුර ක්‍රීඩා දෙපාර්තමේන්තු ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පැවති අන්තර් බළඇණි කරාතේ තරඟාවලියේ අනුශූරතාවය 14 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව විසින් හිමිකර ගන්නා ලදී.

## දුර පැනීමේ ඉසව්වෙන් දස්කම්



නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයෙහි 2018 මැයි මස 03 වන දින පවත්වන ලද අන්තර් සේනාංක මළල ක්‍රීඩා තරඟාවලියේ දුර පැනීමේ ඉසව්වෙන් දස්කම් පෑ 16 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් නි/10694 2/ලුතිතන් ඩීඑම්කේජී චන්ද්‍රසිරි විසින් තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය හිමිකර ගන්නා ලදී.

# කෙළිබිම ජයගෙන

## කඹ ඇදීමේ ශූරයෝ...




ආරක්ෂක සේනා මූලස්ථානය (කිළි) හා ජාතික කඹ ඇදීමේ සම්මේලනය එක්ව සංවිධානය කළ 14 වන ජාතික මහා කඹ ඇදීමේ තරඟාවලිය පසුගිය පෙබරවාරි 24 සහ 25 යන දෙදින තුළදී කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලීය ක්‍රීඩා පිටියේදී පැවත්විණ. එයට සමගාමීව ජාතික කඹ ඇදීමේ සම්මේලනයේ පූර්ණ අධීක්ෂණය යටතේ පැවති 57 වන සේනාංක අන්තර් ඒකක කඹ ඇදීමේ තරඟාවලියේ ජයග්‍රහණය 16(සේවා) ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම දිනා ගැනීමට සමත් වූහ. බළඇණි 07ක් තරග වැදුණු මෙම තරඟාවලියේ ජයග්‍රාහී කණ්ඩායම වෙත ශූරතා කුසලාන, පදක්කම් හා සහතික පත් ප්‍රදානය 57 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීසී අයිපී විසින් සිදුකරන ලදී. ජාතික කඹ ඇදීමේ සම්මේලනයේ සභාපති, 573 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ආර්ජේජේඑන් රණසිංහ, ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීහු රැසක් ද මෙම අවස්ථාවට එක්වූහ.

## අභියෝගතා වොලිබෝල් ශූරයෝ



64 වන සේනාංකාධිපතිගේ සංකල්පයකට අනුව එම සේනාංක බලප්‍රදේශයේ සේවයේ නියුතු හමුදා සමාජිකයින්ගේ ක්‍රීඩා කුසලතාවයන් වර්ධනය කිරීමත්, ඒ තුළින් ජාතික මට්ටමේ ක්‍රීඩකයින් බිහිකිරීමත්, හමුදා සාමාජිකයින් තුළ සුහදතාවය ඇති කිරීමත් අරමුණු කොටගෙන පැවත්වූ අභියෝගතා වොලිබෝල් ශූරතාවලියේ ශූරතාවය 13 වන ශ්‍රීලංකා ජාතික ආරක්ෂක බලමුළු කාණ්ඩායම හිමිකර ගත්හ. එම ජයග්‍රාහි කන්ඩායම ඒකක වැ:බ අණදෙන නිළධාරි මේජර් ආර්එම්ජ්බී හේරත් සමඟ සමූහ ඡායා රූපයකට පෙනී සිටිමින්.

## අත්පන්දු ශූරයෝ



යාපනය අර්ධද්වීපයේ ස්ථානගත 11(සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව විසින් පසුගිය සිංහල දෙමළ අළුත් අවුරුදු උදාව සැමරීම නිමිත්තෙන් සාමය, සහජීවනය සංකේතවත් කරමින් ද්‍රවිඩ ක්‍රීඩා සමාජ හා යුද හමුදාව අතර, අත්පන්දු තරඟාවලියක් පවත්වන ලදී. ද්‍රවිඩ ක්‍රීඩා සමාජ 24ක් හා යුද හමුදා කණ්ඩායම් 02ක් සහභාගී වූ මෙම තරඟාවලියේදී කුරුක්කල්මඩම් ඒෂියන් ක්‍රීඩා සමාජය පරදවා 11 (සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම ජයග්‍රහණය වාර්තා කළ අතර, කුරුක්කල්මඩම් පැරණි කලෙවානි පාසල් ක්‍රීඩාංගණයේ දී මෙම තරඟාවලිය පැවැත්විණ.

## Wedding Wishers



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ 17 (සේවා) ගජබා රෙජිමේන්තුවට අයත් **සෙ/ජී100985 සාසෙ සුහසිංහ ඩීජීඩීඑම් හා ඩී.ජී සඳුනි මධුමේලා මෙනවිය.**



14 (සේවා) ගැමුණු හේවා රෙජිමේන්තුවට අයත් **සෙ/14එෆ්01391 කෝප්‍රල් ලක්මාල් කුමාර ඩබ්ලිව්එස් හා උපුලිකා සංදීපනී දේවපුර මෙනවිය.**



16 (සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් **සෙ/එච්101334 සාසෙ තරංග ටීඑච් එස් හා ඒඑම්ආර් සඳමාලි මෙනවිය.**



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ 15 (සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට අයත් **නි/9797 කපිතාන් කේඑන් ප්‍රියංකර හා කේ ගිහානි කුමාරසිංහ මෙනවිය.**

# ඒකක විත්ති

## මව් ඒකකයේ තොරතුරු සොයා...

ස්වේච්ඡා බළසේනාවේ 27වන නියෝජ්‍ය සේනාවිධායක ලෙස පත්වීම් ලැබූ මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි පසුගිය දා තම මව් ඒකකය වූ 5(සෙව්) ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. තම ඒකකයට අභිමානයක් ගෙන ආ නියෝජ්‍ය සේනාවිධායක එදින 5(සෙව්) ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තු වැ.බ. අණදෙන නිළධාරි මේජර් ටීවීආර් පෙරේරා ආර්එස්පී ශ්‍රීලකාහ ඇතුලු නිළධාරින් හා සෙසු නිළයින් විසින් සම්මාන මුරයක් පිළිගන්වා තම ඒකකයේ ගෞරවය පුදකරන ලදී. එදින එම ඒකක සෙසු නිළයින්ගේ සුභ සාධනය වෙනුවෙන් ඉදිකල හට නිවාසයක්ද නියෝජ්‍ය සේනාවිධායක ගේ සුරතින් ඔවුන්ගේ අයිතියට පවරන ලදී.



## සේවය අගයා...



වැලිඔය ඇතාවැටුණුවැව ප්‍රදේශයේ ස්ථානගත 14(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාවේ වැ.බ. අණදෙන නිළධාරි මේජර් සී ජයවීර ශ්‍රීලපාහගේ සංකල්පයක් මත පසුගියදා එම ඒකකයේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන්ගේ සේවය අගයා ත්‍යාග ප්‍රදානයක් සිදුකරන ලදී.

## නව නේවාසිකාගරයක්...



නෙදුන්කර්නි ප්‍රදේශයේ ස්ථානගත 17(සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවේ ඉදිකරන ලද නිළධාරි නේවාසිකාගාරය විජයබාහු රෙජිමේන්තු අධිපති හා කිළිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඒ කාරියකරවන යූඑස්පී එන්ඩීසී විසින් 2018.03.07 වන දින විවෘත කරන ලදී. ඒකක නිළධාරි, සෙනින්ගේ ශ්‍රම දායකත්වයෙන් කාමර 11කින් සමන්විතව ඉදිකරන ලද මෙම නේවාසිකාගාරය විවෘත කිරීමේ උත්සවය සඳහා මොණරවැව විහාරස්ථානයේ විහාරාධිපති හා 56 සේනාංකයේ කර්නල් සම්බන්ධිකරණ නිළධාරි ඇතුලු විශාල පිරිසක් එක්වුහ.

## දැනුවත් කරමින්...



ලෝක එච්අයිවී/එඩ්ස් නිවාරණ දිනය තේමා කරගනිමින් ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) හි සම්පත් දායකත්වය ඇතිව 2(සෙව්) වෛද්‍ය බළකාය විසින් ලිංගාශ්‍රිත බෝවන රෝග වලින් ආරක්ෂාවීමේ කාලෝචිත වටිනාකම පිළිබඳ යුද හමුදා සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පසුගිය දෙසැම්බර් මස 01 වන දින ශ්‍රීලයුයුබ දේශන ශාලාවේදී පවත්වන ලදී. ලුතිතන් (උපා)කේජීඩී රවීන්‍ද්‍ර ද සිල්වා අදාළ දේශනය පැවැත් වූ අතර මේ සඳහා යුද හමුදා සාමාජික සමාජිකාවේ විශාල පිරිසක් එක්වූහ.

## සුහදත්වය වර්ධනය කරමින්



යුද හමුදාව සහ සිවිල් ජනතාව අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව 224 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ඊඒපී එදිරිවීර ආර්ඩබ්ලිව්පී ගේ උපදෙස් අනුව 24 ශ්‍රීලංජාආබමු ඒකක අණදෙන නිළධාරි මේජර් එම්ඒසීපී මාරසිංහ ශ්‍රීලංජාආබමු ගේ මගපෙන්වීම මත පසුගිය අප්‍රේල් මස 21 වන දින දෙහිවත්ත ප්‍රදේශයේදී බක්මහ උළෙලක් පවත්වන ලදී. මෙම බක්මහ උළෙල සඳහා සිවිල් ජනතාව විශාල පිරිසක්ද සහභාගී වූහ.

## කායවර්ධන මධ්‍යස්ථානය විවෘත කරමින්



වැලිඔය ඇතාවැටුණුවැව ප්‍රදේශයේ ස්ථානගත 14 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදා මූලස්ථානයේ නවතමයෙන් ඉදිකරන ලද කායවර්ධන මධ්‍යස්ථානය වැ.බ. අණදෙන නිළධාරි මේජර් සී ජයවීර ශ්‍රීලපාහගේ ආරාධනයෙන් 62 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එල්ඒඑන්එස් වනිගසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සුරතින් පසුගියදා ඒකක සාමාජිකයින්ගේ අයිතියට පවරා දෙන ලදී.

## සෙසුනිළ අයිතියට පවරමින් ...



කල්මුණේ ප්‍රදේශයේ ස්ථානගත 16 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ වැ.බ. අණදෙන නිළධාරි මේජර් ඩීඑම්බී දිසානායක ගේ උපදෙස් මත ඉදිකරන ලද එම ඒකක ප්‍රධාන පිවිසුම් දොරටුව හා සෙසුනිළ භෝජනාගාරය පසුගියදා ආරක්ෂක සේනා මූලස්ථානය නැගෙනහිර අඥාපති මේජර් ජෙනරාල් ඩීඩීයුකේ හෙට්ටිආරච්චි ආර්එස්පී යූඑස්පී පීඑස්සී විසින් විවෘත කරන ලදී.

## පුහුණුවක අවසානය



යුද හමුදා ජනපදය පනාගෙඩ ස්ථානගත 2(සෙව්) ශ්‍රී ලංකා යුද හමුදා වෛද්‍ය බලකාය විසින් වැඩකරන දින 90ක කාලයක් ආවරණය වන පරිදි පැවැත්වූ III පෙළ පුහුණු හෙද සහායක පාඨමාලාව පසුගියදා නිමාවට පත්විය. එහි අවසන් දේශනය අණදෙන නිළධාරි විසින් පැවැත් වූ අතර, පාඨමාලාව හැදෑරූ සිසු සිසුවියෝ එදින විවිධ ප්‍රංසගයක් ද ඉදිරිපත් කළහ.

## කොනොනි සමාජ ශාලාව විවෘත කරමින්





වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගත 2 (සෙව්) ශ්‍රී ලංකා සංඥා බළකායේ ඉදිකරන ලද නව කොනොනි සමාජ ශාලාව පසුගියදා එම බළකායේ අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් බීඑම් ජයවීර පීඑස්සීගේ සුරතින් විවෘත කරන ලදී.

## සංහිඳියාවට මග හසර විවර කරමින්




සාමය සංහිඳියාව හා ජාතීන් අතර සුහදතාවය ගොඩනැංවීමේ අරමුණින් 22 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීජී ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ගේ සංකල්පයක් මත 224 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ඊජීපී එදිරිවීර ආර්ඩබ්ලිව්පී ගේ අධීක්ෂණය හා 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු අණදෙන නිළධාරි මේජර් එම්එස්පී මාරසිංහ ගේ උපදෙස් මත සංවිධානය කරණු ලැබූ පාපන්දු තරඟාවලියක් 2018.03.15 දින මූතූර් මහජන ක්‍රිඩාංගනයේ දී පවත්වනු ලැබීය. එහිදි 22 සේනාංක පාපන්දු කණ්ඩායම හා මූතූර් පාපන්දු ලීග් කණ්ඩායම තරඟ වැදුණු අතර, එහිදි 3 - 1 ජයක් වාර්තා කිරීමට 22 සේනාංක පාපන්දු කණ්ඩායම සමත් වූහ. ජාතීන් අතර සමඟිය හා සහජීවනය කදිමට කියාපාමින් ප්‍රදේශයේ බෞද්ධ, හින්දු  මුස්ලිම් ආගමික නායකයෝ ඇතුළු ප්‍රභූන් රැසක්ද සිවිල් ජනයා විහාල පිරිසක් ද එම අවස්ථාවට එක්වූහ.

# විවිධ පුවත්

## මව් රෙජිමේන්තුවේ බුහුමන්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමී බළකායේ ප්‍රථම බ්‍රිගේඩියර් වශයෙන් නිළ උසස් වීම් ලැබූ බ්‍රිගේඩියර් ටීටීපී සිල්වා පසුගිය දෙසැම්බර් මස 21 දින මතුගම පැලවත්ත පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ කඳවුරු සංචාරයක නිරත විය. එදින ඔහු වෙනුවෙන් කඳවුරු සම්මාන මුරයක් පිරිනැමූ අතර, බ්‍රිගේඩියර් ටීටීපී සිල්වා විසින් එදින පුරෝගාමී බළකා රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීමක් ද සිදුකරන ලදී. තම සංචාරය සිහිවීම වස් රෙජිමේන්තු මධ්‍යස්ථාන භූමියේ පැලයක් රෝපණය කිරීමද එදින ඔහුගේ අතින් සිදුවිය.

## සෙබළ සහනය පතා



වැලිඔය ඇතාවැටුණුවැව ප්‍රදේශයේ ස්ථානගත 14 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදා මූලස්ථානයේ නවතමයෙන් ඉදිකරන ලද ගොඩනැගිලි සංකීර්ණය වැ.බ. අණදෙන නිළධාරි මේජර් සී ජයවීර ශ්‍රීලපාහගේ ආරාධනයෙන් 62 සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එල්ඒඑන්එස් වනිගසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ සුරතින් පසුගිය දා ඒකක සාමාජිකයින්ගේ අයිතියට පවරා දෙන ලදී.

ඒකක සාමාජිකයින්ගේ දැඩි කැපවීම හා දායකත්වය මත ඉදිකෙරුණු සෙසුනිළ භෝජනාගාරය, කණ්ඩායම් කාර්යාල සංකීර්ණය හා කාය වර්ධන මධ්‍යස්ථානය, එහිදි විවෘත කළ අතර, මෙම අවස්ථාවට 622 බළසේනාවේ බළසේනාධිපති බ්‍රිගේඩියර් එම්පී කරුණාරත්න අයිපී, 621 බළසේනාවේ බළසේනාධිපති පීඑස්කේ සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, 62 සේනාංකයේ කර්නල් සම්බන්ධීකරණ නිළධාරි (සෙව්) කර්නල් සීයූ ගමඇතිගේ ඇතුළු යුද හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිළධාරිහූ රැසක්ද එක්වූහ.

## නව සෙසුනිළ භෝජනාගාරයක් ...




සෙත්සිරිගම තන්තිරිමලය ප්‍රදේශයේ ස්ථානගත 5 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සෙසුනිළයින්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකළ නවතම සෙසුනිළ භෝජනාගාරය වැ.බ, අණදෙන නිළධාරි මේජර් එල්ආර්ටීබීපී බණ්ඩාර ශ්‍රීලංජාආබමු විසින් පසුගියදා සෙසුනිළයින්ගේ අයිතියට පවරන ලදී. 2016 මූලධන සේවාවන් වෙනුවෙන් ලද ප්‍රතිපාදන හා ඒකක අරමුදල් වැයකර ඉංජිනේරු බළකා සෙබළුන්ගේ හා ඒකක සාමාජිකයින්ගේ තාක්ෂණික ඥානය මෙන්ම ශ්‍රමදායකත්වයෙන් මෙම සෙසුනිළ භෝජනාගාරය ඉදිකරන ලදී.

## වෙසක් පහන් කූඩු ප්‍රදර්ශනයක්

පසුගිය වෙසක් පොහෝ දිනය නිමිති කොටගෙන 22 සේනාංකය යටතේ ඇති බසේමු හා ඒකක අතර වෙසක් පහන්කූඩු ප්‍රදර්ශනයක් පැවැත්විණ. එම ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත්කර තිබූ වෙසක් පහන් කූඩු අතරින් 24 ශ්‍රීලංජාආබමු වෙතින් සම්බුදු තෙමගුල නිරූපනය වන පරිදි ඉදිරිපත් කරනු ලැබූ ආකර්ෂණීය පහන් කූඩුව එහි සැමගේ ඇගයුමට බඳුන් විය. ඒකක අණදෙන නිළධාරි මේජර් එම්ජ්සීපී මාරසිංහගේ මඟ පෙන්වීම මත එම ඒකක සමාජිකයෝ අදාල පහන් කූඩුව නිර්මාණයට දායක වූහ.





# විජිතපුර විත්ති

**මාගේ මේ ව්‍යයාමය තෙමේ කිසි කලෙකත් රාජ්‍ය සුඛය පිණිස නොවන්නේය. හුදු සම්බුද්ධ ශාසනයේ ප්‍රතිෂ්ඨාපනය පිණිසම වන්නේය"**
**(දුටුගැමුණු මහ රජතුමා)**

"මහාවංශය, දීපවංශය, ථූපවංශය, සද්ධර්මාලංකාරය වැනි ඓතිහාසික මූලාශ්‍ර අනුව සලකා බලන විට විජිතපුරයේ ආරම්භය ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම තෙක් ඈතට විහිදී යයි. විජය රජතුමාගේ සොහොයුරාත් තමන්ගේ නමින් ගම් ඉදි කොටගෙන විසූ බව මහා වංශයේ සඳහන්ව ඇත. මේ අනුව සලකා බලන විට විජිතපුරයේ නිර්මාතෘවරයා මේ දෙදෙනාගෙන් එකෙකු බව පැහැදිලිය. මුලදී විජිතපුරය නමින් හැඳින්වූ මෙය නගරයක් බවට පත්වීමෙන් පසු විජිතපුරය නමින් ප්‍රකට වන්නට ඇත. එදා මේ අයුරින් විශාල ප්‍රදේශයක් වසා පැතිරී සිටි විජිතපුරය අද විහාර භූමියටත් ඒ අවට අක්කර හතලිස් පහක පමණ නටඹුන් සහිත කුඩා බිම් තීරුවකටත් සීමා වී ඇත. ධාතුසේන රාජ්‍ය කාලයේ ඉදිවූ කලා වැවේ ගිලුන විජිතපුරය විජිත පුර විහාරයේ එල්ලගෙන යන්තම් පණ රැකගෙන සිටින අයුරු විමසිලි සහිතව බලන්නෙකුට පෙනේ.

විජිතපුර රජමහා විහාරයේ ආරම්භය සොයා ගැනීමට ජනප්‍රවාද හැර දනට අප සතුව ඇති ඓතිහාසික මූලාශ්‍රයන්ගෙන් පිටුවහලක් නොලැබේ. ජනප්‍රවාද අනුව මෙහි ආරම්භය දුටුගැමුණු යුගය තෙක් ඈතට විහිදී යයි. ක්‍රි: පූ: දෙවන සියවසේ මුල් භාගයේදී ලංකාව ආක්‍රමණය කළ එළාර නම් සොලී කුමරා ආනුරාධපුර රාජධානිය

යටත් කොටගෙන එහි රජවිය. ඔහු තම රාජ්‍යයේ ආරක්ෂාව පිණිස තැනින් තැන කඳවුරු පිහිටුවිය. එළාර රාජධානිය කරගෙන විසූ ආනුරාධපුර රාජධානියට කිට්ටුවෙන්ම වූ බලකොටුව විශේෂයෙන්ම තර කොට ශක්ති සම්පන්නව පිහිටුවාගෙන තිබුණ බව අපට සිතාගත හැකිය. සද්ධර්මාලංකාරය මෙම බලකොටුව පිළිබඳ කියවෙන්නේ මෙසේය.

"ඒ විජිතපුර වනාහි වියලා අගලය, කළල් දිය අගලය, යැයි අගල් තුනකින් පරික්ෂිප්තය. අටලොස් රියන් වුය. මහ පවුරකින් වට කරන ලද්දේය. ඒ ඒ තැන්වල නොයෙක් සිය ගණන් මහා බල යෝදයන් විසින් ගැවසී ගත්තා වූද දිගු පුළුල ඇති මහා වාසලින් හා යදොරින් යුක්තය. පව්ර මුදුන ඒ ඒ තැන්හි කරන ලද අට්ටාල, බලකොටු, ඉඩගිණි, කුරුබිලි, පලිමුගම් ආදියෙහි සිටියවුන් විසින් ගසන බිඳිනා ලද අසීශක්ති තෝමර, හේන්විවාල තලවාලාධර්ම, චන්ද්‍රකාදී නානාප්‍රකාර ආයුධ වර්ෂාවෙන් හා ශර ප්‍රහාරයෙන් අති භයානකය. එසේම යතුරු, දුණු, යන්ත්‍ර, පාෂාණ, යවටාදියෙන්, කකාර දමන ලද යමල, දුම්මල, කැකුණ මල ආදියෙන් ද අවසරක් නැත්තේය."

මෙසේ වූ එළාර බලකොටුව වෙත ගැමුණු රජු ඇතුළු යුද සේනාව මියුගුණාවෙන් යුද්ධය පටන් ගෙන සූවිස්සක් බලකොටු එකින් එක බිඳ විජිතපුරයට පැමිණි විට මුලින් ජයගත් බලකොටුවල ඉතිරි වූ දෙමළ යුධ සේනාව විජිතපුර බලකොටුව වෙත පැමිණ විත් සිටි හෙයින් විජිතපුර බලකොටුව වඩාත් ශක්තිමත් බලකොටුවක්ව තිබිණි.

එහෙත් රණශූර දුටුගැමුණු රජතුමා විසින් සාරමාසයක් මුළුල්ලේ එල්ල කරන ලද දැවැන්ත ප්‍රහාරයෙන් එය සුණුවිසුණු වී ගියේය. අනුරාධපුර රාජධානිය එක්සේසත් කිරීමෙන් අනතුරුව විජිතපුර සටනේ දී තමා ලද ජයග්‍රහණය සිහිවීම සඳහා එතුමා විසින් මෙම භූමියෙහි ථූපයක් ඉදිකොට පුද සත්කාර දක්විණි. වර්තමානයේදී විජිතපුර රජමහා විහාර මළුව මැද පොලොව පලා මතුවුන රිදී දිය බුබුලක් සේ බබළ බබලා සිටින චෛත්‍ය රාජයා කලින් කළ අලුත් වැඩියාවට භාජනය වී පෙනේ. මේ අනුව විජිතපුර රජමහා විහාරයේ නිර්මාතෘවරයා දුටුගැමුණු මහ රජතුමාය.

අනුරාධපුර යුගයට නෑකම් කියන මෙම විහාරස්ථානයේ තැනින් තැන මුරගල්, ගල්පඩි, දොරටුව, ශ්‍රී පතුල්, ගල් කණු, කැසිකිලි ගල් ආදිය ගැන සිතන විට මෙහි පැරණිකම පිළිබඳව සිතා ගැනීම් කෙනෙකුට අපහසු නොවේ. එහෙත් විජිතපුර බලකොටුව පිහිටි ස්ථානය පිළිබඳව උගතුන් අතර එකඟ බවක් නැති බව පෙනේ. සමහර උගතුන්ගේ අදහස වන්නේ විජිතපුරය පොළොන්නරුව අසල පිහිටි බවය. පොදු ජනතාවගේ එකම පිළිගැනීම වන්නේ බලකොටුව තිබින විජිතපුරය උතුරු මධ්‍යම පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාවැව සමීපයෙහි විජිතපුර රජමහ විහාරය ඇසුරු කරගෙන තිබූ බවයි.

ඉතිහාසඥයන් විජිතපුර බලකොටුව මෙයමද යන්න පිළිබඳව සැක පහළ කිරීමට හේතුව නූතන යුගය වන විට විජිතපුර බලකොටුව පිළිබඳ රචනා වූ ඓතිහාසික ග්‍රන්ථවල සඳහන් කිසිම සාධකයක් විජිතපුර රජමහ විහාරස්ථානයේ අවටින් නොලැබීමයි. විජිතපුරය ගැන සඳහන් කරන සාහිත්‍ය හා ඓතිහාසික ග්‍රන්ථ අනිවාර්යයෙන්ම බලකොටුවක් පිළිබඳව සඳහන් කරයි. බලකොටුවක් තිබුණේ නම් එහි නෂ්ටාවශේෂ තිබිය යුතුමය. එහෙත් මෙහි කිසිම හෝඩුවාවක් දක ගන්නට නැත. එහෙත් ජනප්‍රවාදවලත්, ඓතිහාසික තොරතුරුවලත්, සඳහන් වන පරිදි බලකොටුවක් යනු සුලු ප්‍රදේශයක් වීමට කොහෙත්ම පුලුවන් කමක් නොමැත. මෙම කාලයේදී ජනතාව ජීවත් වූ නගරය වටා පවුරු බඳින ලද්දේ පරසතුරු ආක්‍රමණ වලින් මිදීම සඳහා පමණක් නොව නොයෙක් ආකාරයේ සතුන්ගෙන් ස්වභාව ධර්මයාගේ උපද්‍රව වලින් මිදීම සඳහා විය හැකිය. මේ අනුව සලකා බලන විට විජිතපුර බලකොටුවෙහි පවුරුද සැතපුම් අටක් දහයක් දුරින් පිහිටා තිබෙන්නට ඇත. ඒ ගැන විමසිලිමත්ව බලන්නෙකුට විජිතපුර රජමහා විහාරයේ දකුණ දෙසට ගමන් කිරිමේදී සැතපුම් හතර (04) කදී පමණ බලකොටුවේ ප්‍රාකාර යැයි සිතිය හැකි ගල් වැටක්ද, විජිතපුර විහාරයට බටහිරින් සැතපුම් තුනක(03) පමණ දුරින් ගල්නෑව නම් ප්‍රදේශයට නුදුරුව ප්‍රාකාරයේ සලකුණු ද, උතුරින් එපමණ දුරකින් ප්‍රාකාරයේ යැයි සිතිය හැකි නෂ්ඨාවශේෂ යන්ගෙන්ද බලකොටුවක් තිබූ බවට සාධක හෙළිවේ. ක්‍රි: පූ: තුන් වන සියවසේ ධාතුසේන මහ රජතුමා විසින් කලාවැව ඉදිකරන ලදී. ක්‍රි: පූ: දෙවෙනි සියවසේ මුල් භාගය පමණ වන විට කලාවැව නමින් ජලාශයක් නොතිබිණ. ධාතුසේන රජතුමා දුටුගැමුණු යුගයෙන් පසු තම රාජ්‍ය කාලයේදී විජිතපුර රජමහ විහාරයට පමණක් සීමාවිය. එයට හේතුව බලකොටුවෙන් විශාල ප්‍රමාණයක් කලා වැවට යටවී යාමයි. අද ජලය මධ්‍යයෙහි ඇති ගල් බැම්ම








දෙස විමසිලිමත්ව බැලීමේදී එය බළකොටුවෙහි බැම්ම විය හැකි යැයි අනුමාන කළ හැකිය. මෙම කරුණු නිසා විජිතපුර බළකොටුව මෙයම යැයි විශ්වාස කරණු ලැබේ.

එසේම මෙම බළකොටුව පිළිබඳව සඳහන් කිරීමේදී වියලි අගල්, කළල් අගල්, දිය අගල්, ආදියේ නෂ්ඨාවශේෂයෙන් දක්නට නොමැති නිසා මෙය විජිතපුර බළකොටුව නොවන්නට හැකි බව ඉතිහාසඥයන්ගේ පිළිගැනීමයි. එහෙත් එකළ අගල් වශයෙන් හැඳින්වූ දේ වර්තමානයේදී "වළ" වශයෙන් භාවිතා වන්නේ යැයි පොදු ජනතාවගේ පිළිගැනීමයි. විජිතපුර රජමහා විහාරය සමීපයෙන් වර්තමානයේදීදක්නට ලැබෙන පාහිවල, දිගන්වල, නවඩවල යන නම් වලින් හඳුන්වනු ලබන්නේ මෙම අගල් විය හැකිය. එසේම විජිතපුරය අවට ඇති දෙමළ අක්කරය, කරුක්කන් කුලම, කාඤ්ජනන් කුලම, පුලියන් කුලම, අමනක් කට්ටුව, ඉච්චන් කුලම වැනි ග්‍රාම නාම වලින්ද පෙනී යන්නේ පුරාණය සිටම මේ ප්‍රදේශ වලට තදින්ම දෙමළ බලපෑම තිබූ බවය.

විජිතපුර රජමහා විහාරය අවට විශාල ලෙස පෞරාණික ගොඩනැගිලි වල සළකුණු ඇති බව අපට පෙනී යයි. වර්තමාන විහාර භූමියට නැගෙනහිර දෙසින් දිගින් දිගට පිහිටි උස් කළුගලට ගැමි ජනතාව විසින් ව්‍යවහාර කරනු ලබන්නේ "ඔත්තු ගල" වශයෙනි. විජිතපුර බළකොටුව පවත්නා අවධියෙහි මාලිගාවල ආරක්ෂාව පිණිසත්, ඇතැම් විට සතුරන් පැමිණෙනවා දැයි බැලීම සඳහාත් මුරකරුවන් නැවැත්වූ තැන යැයි විශ්වාස කරන ජනතාව එනිසාම "ඔත්තු ගල" වශයෙන් හඳුන්වන්නට ඇත. එසේම මෙම ස්ථානයේ සිට සැතපුම් භාගයකට (1/2) පමණ දුරින් ඉහත සඳහන් ගලටම අනුරූප වූ ගල් පිහිටා ඇත. මෙයද ඔත්තු ගලේ සහය පිණිස තවත් මුරකුටියක්ව තිබූ බව උස්ගල වශයෙන් හඳුන්වනු ලැබෙති.

ඉතිහාසගත පුවත් අනුවත් ජනප්‍රවාද අනුවත් විජිතපුර යුධ භූමියේදී එළාර දුටුගැමුණු දෙදෙනා අතර ඇති වූ ද්වන්ද සටනේදී එළාර රජු පරාජයට පත්විමෙන් අනතුරුව පලාගිය බව සඳහන් වේ. ජනප්‍රවාද වල සඳහන් පරිදි මෙසේ එළාර රජු අනුරාධපුරය දක්වා පලාගෙ ාස් ඇත්තේ පොලව යටින් සාදන ලද රහස් උමගක් මගින් යැයි කියයි. එමෙන්ම ඔහු පසුපස ලුහු බඳින ලද දුටුගැමුණු රජතුමා අනුරාධපුරයේදී එළාර රජ පරාජයට පත් කළ බවද වංශ කථාවල සඳහන් වේ. මෙසේ ප්‍රකාශිත මෙම කරුණට ද විජිතපුර රජමහ විහාරයේ සිට සැතපුම් එකහමාරකට (1.1/2) පමණ දුරින් ඉතා වැදගත් නෂ්ඨාවශේෂයක් දැකගත හැකිය. එම ස්ථානය පොළව තුළට බැසිය හැකි අයුරින් නිමවූ ළිඳක් වැනි ස්ථානයකි. මෙම ස්ථානය එළාර රජු  පැනගිය උමග යයි ජනතාව විශ්වාස කරති. වර්තමානයේදී එම ස්ථානය හඳුන්වනු ලබන්නේ ගල්ළිඳයාය නමින්ය. මෙම කරුණද සත්‍යභාවයක් ඇතොත්  මෙය  විජිතපුර බළකොටුව බවට  ප්‍රබල සාක්ෂියක් වන්නේය.

විජතපුර රජමහා විහාරයේ විහාර භූමිය තුළින් පුරාවිද්‍යාත්මක නෂ්ඨාවශේෂයන් සුළු ප්‍රමාණයක් දැක ගත හැකිය. ඒ අතරින් පුරාණ චෛත්‍ය රාජයාණන් වහන්සේ, මහානාම මාහිමියන්ගේ යැයි සැලකෙන සොහොන් කොත. කඩුගැගල මුරපොල යයි සිතිය හැකි නටඹුන් ස්ථානය, බහිරව රූපය,  යන මේවා ඉතාමත් වැදගත් ස්ථානයක් හිමිකර ගනියි. ඒ අතර විජිතපුර රජමහා විහාරය අවට ඇති පෞරාණික ගොඩනැගිලි වල නටඹුන් කුමන යුගයකට අයත් දැයි නොදනී. කෙසේ හෝ වේවා විධිමත් පරීක්ෂණයකින් එළිදකින විශ්වාසනීය සාධක මත ගොඩනැගුණ සාධක එළඹෙන තුරු අපද පොදු ජනතාව අනුව යමින් ඒ මතයම පිළිගනිමු.

**උපුටා ගැනීම**
**විජිතපුර රජමහාවිහාරධිපති**
**හල්මිල්ලවැවේ ශ්‍රී ධම්මාරාම නාහිමි පානන් වහන්සේ ගේ**
**"විජිතපුර විත්ති" කෘතිය ඇසුරෙනි''**

# දිවිය දිනූ දිරිය විරුවෙක්



2 (සෙව්) ශ්‍රී ලංකා සංඥා බළකායට අයත් සෙ/2සී00559 සැරයන් දේශප්‍රිය එල්ජේපී යුද හමුදාවට සම්පතක් සේම අභිමානයකි. යුද හමුදාවට බැඳුන දින පටන්ම අධිෂ්ඨාන ශීලී ගමනක නිරතව ඇති ඔහු සිය වෘත්තිය වෙනුවෙන් වූ අධික කැපවීම නිසාම අත්කරගෙන ඇති සාර්ථකත්වය පහත දක්වා ඇති ජයග්‍රහන ඔස්සේ කදිමට කියාපායි.

- 2004 අගෝස්තු 25 දින ආධුනික සෙබළෙකු ලෙස යුද හමුදාවට එක්ව ඇති ඔහු සංඥා රෙම- පනාගොඩ වෙතින් පැවැත්වූ එම පාඨමාලා අංක 08 හි සැම අතින්ම අතිශූර සෙබළාට හිමි කුසලානය හිමිකර ගැනීම.
- සංඥා පුහුණු පාසල බූවැලිකඩ මහනුවර වෙතින් පවත්වන ලද මූලික සංඥා පාඨමාලා අංක 89 හදාරා ඉන් ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- සටන් පුහුණු පාසල අම්පාර වෙතින් පවත්වන ලද කනිෂ්ඨ උපදේශක පාඨමාලා අංක 57 හදාරා එහි ප්‍රථම ස්ථානය හා සැම අතින්ම අතිශූර සෙබලාට හිමි කුසලානය හිමිකර ගැනීම.
- යුහශාඅපුපා පනාගොඩ වෙතින් පවත්වන ලද සහකාර ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක: 82 හදාරා ඉන් දෙවන ස්ථානය හා උසස් ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව හැදැරීම සඳහා සුදුසුකම් ලබා ගැනීම.
- කරෙපුපා ඌව කුඩාඔය වෙතින් පවත්වන ලද මූලික පැරෂුට් පාඨමාලා අංක: 50 ඉතා සාර්ථකව හැදෑරිම.
- යුහශාඅපුපා පනාගොඩ වෙතින් පවත්වන ලද උසස් ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක 30 හදාරා විශිෂ්ඨ සාමාර්ථයක් සමගින් විදේශීය ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබාගැනීම හා සමස්ථ පාඨමාලාවේ 06 වන ස්ථානය හිමිකර ගැනීම.
- ඉන්දියාවේ යුද හමුදා ශාරීරික අභ්‍යාස ආයතනය වෙතින් පවත්වන ලද විදේශීය ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව සාර්ථකව හැදෑරීම.
- සබුබපුපා පැලවත්ත වෙතින් පවත්වන ලද විශේෂ මූලික බුද්ධි පාඨමාලාවෙහි ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- දියතලාව යුද හමුදා විද්‍යාපීඨය වෙතින් පවත්වන ලද සරඹ උපදේශක පාඨමාලාව අංක: 111 ඉතා සාර්ථකව හදාරා ඉන් ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- ඉන්දියාවේ කනිෂ්ඨ නායක විද්‍යාපීඨයේ පවත්වන ලද කනිෂ්ඨ නායකත්ව පාඨමාලා අංක 109 සාර්ථකව හැදෑරීම.
- යුද හමුදා විද්‍යාපීඨය වෙතින් පවත්වන ලද උසස් සරඹ උපදේශක සංස්කරණ පාඨමාලාවෙහි ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- තවද 2018.03.18 වන දින සිට 2018.05.03 වන දින දක්වා බංගලාදේශ යුද හමුදා විද්‍යාපීඨයෙහි පවත්වන ලද සරඹ උපදේශක පාඨමාලා අංක 71 ඉතා සාර්ථකව හැදෑරූ මෙම ජ්‍යෙකොනොනි 2 වන ස්වේච්ඡා ශ්‍රී ලංකා සංඥා බලකායේ පළමුවන විදේශීය සරඹ උපදේශක පාඨමාලාවක් හදාරන ලද ජේකොනොනි ලෙස ඒකක ඉතිහාසයට එක්වීමද විශේෂත්වයකි.

# කවි උල්පත




**අපේ අම්මා**

හිරුට පෙර අවදිව
සඳුට පසු නිදියන....

කඳුලෙන් ගිනි දල්වා
බොල් වියෙන් බත පිසින.....

වැලි මිරිකා වතුර ගෙන
ඉඩෝරයේ කෙත් අස්වද්දන....

කරගැට පිරි දෑතින්
සුමුදුව මා පිරි මදින....

නේක දුක් සුසුමන්
ළය සිදුරු කරන් නුඹ....

සෙනෙහසින් අප තැනූ
පොතක ලියමින් කථා.. කෙසේ මං
පහදම් ද..?
මැක්සිම් ගොර්කිගේ ''අම්මා''
නොවේ නුඹ......

**හංසි විජේසිංහ**

**අන්සතු මලක් දැයි...**

රට වෙරළු පැහැති ගවුමෙන් හැඩවී උදයේ
නුඹ යන්තීය දෙවඟන ලෙස ලහි ලහියේ
දෙනෙත් වලින් ඉඟිපාන මියුලැසියේ
පෙම් සිතුවිලි පුබුදනු කිම මගේ ලයේ

ගිනි අව් අත දරා මුරකුටි තුළට වෙලා
නුඹ ඇතින් යනෙනා සැටි සිටිමි බලා
නාදළු දෙතොල්, සඳවත නුඹෙ සිහිවීලා
කෙලෙසක ඉඳිනු මගෙ සෙනෙහස සඟවාලා

කෙටි පණිවුඩ වලට නැහැ පිළිතුරු ලැබුණේ
පෙරදා දුටුව හසරැලි අද නැත මුහුණේ
අන්සතු මලක් දැයි මට නිකමට සිතුනේ
සිහින මාළිගා බොඳවී බිම වැටුණේ

**සෙ/එල්100140 සාසෙ ජයලත් බණ්ඩාර එච්එම්ජීඑස්**
**වෛද්‍ය පරීක්ෂණාගාරය**
**ශ්‍රීලංයුහසෙව්බමු.**

# සංචාරයක පිය සටහන්

## 2 (සෙව්) ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය



ස්වේච්ඡා බළසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි පසුගිය අප්‍රේල් 04 වන දින පනාගොඩ යුද හමුදා ජනපදයේ ස්ථාපිත 2 ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බළකාය (සෙව්) හි නිරීක්ෂණ චාරිකාවක නිරත විය. මෙම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ නිළධාරීහු රැසක් ද එක්වූහ.

2 ශ්‍රීලයුවෛබ අණදෙන නිළධාරි ඇතුලු එම ඒකක නිළධාරීහු කඳවුරු සම්මාන මුරයක් පිරිනමමින් නියෝජ්‍ය සේනාවිධායක පිළිගැනීමෙන් අනතුරුව, එම සංචාරය සිහිවීම පිණිස පැලයක් රෝපණය කිරීමද, සියලු නිළයින් ආමන්ත්‍රණය කිරීම ද එදින නියෝජ්‍ය සේනාවිධායක විසින් සිදුකරන ලදී.





## 14 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



57 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීවී රවිප්‍රිය ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ අයිජී පසුගියදා විශ්වමඩු පුන්නනිරාවි ප්‍රදේශයේ ස්ථානගත 14 ශ්‍රීලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එදින ඒකක පාලන ගැටළු පිළිබඳ විමසීමක් කළ සේනාංකාධිපති හට පිරිස් ඇමතීමට ද ක්‍රියා කළේය.

## 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



224 බළසේනාවේ බළසේනාධිපති කර්නල් ඊඒපී එදිරිවීර ආර්ඩබ්ලිව්පී පසුගිය පෙබරවාරි මස 13 වන දින ත්‍රිකුණාමලය වෙරුගල් ප්‍රදේශයේ ස්ථානගත 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය.

## 22 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



52 සේමු සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පසුගිය අප්‍රේල් මස 03 වන දින යාපනය වල්ලෙයි ප්‍රදේශයේ ස්ථානගත 22 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. ඒකක පාලන කටයුතු පිළිබඳ විමසා බැලු සේනාංකාධිපති එහිදී ඒකක හට පිරිස් ඇමතීමටද ක්‍රියාකළ අතර, සියලු නිළ තේ පැන් සංග්‍රහයකට ද සහභාගි විය.

# විශිෂ්ටයන් අතර



"නිරෝගී හමුදාවක් නිරෝගී දැයක්" වැඩසටහනේ පළවන අධියර යටතේ පැවති තරඟාවලියේ ආසේමු (නැ) බළ ප්‍රදේශයේ සියලු නිත්‍ය හා ස්වේච්ඡා ඒකක අතරින් ප්‍රථම ස්ථානයත් සමස්ථ යුද්ධ හමුදාවම ආවරණය වන පරිදි පැවති තේරීම් තරඟාවලියේ සිව්වන ස්ථානයත් දිනාගැනීමට 18 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සමත් විය. අදාල ජයග්‍රහණයන්ට හිමි සහතිකපත් හා ත්‍යාග ප්‍රදානය කිරීමේ උත්සවය 2018.03.14 වන දින යුද හමුදා රෝහල් ශ්‍රවණාගාරයේ දී සිදුකළ අතර, 18 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට හිමි සහතිකපත හා ත්‍යාගය යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඩීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ සුරතින් ලබාගන්නා ලදී.



බුත්තල නිළධාරි ප්‍රවර්ධන ප්‍රගමන මධ්‍යස්ථානයේ සේනාවිධායක අතින් ඇගයුම් සහතිකය හිමිකර ගනිමින්....

4 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් නි/8665 කපිතන් ඩබ්ලිව්බීඑන්එන්ඩී විජේවර්ධන ශ්‍රීලංජාආබමු පසුගියදා පැවති කපිතන් සිට මේජර් දක්වා නිළ උසස් කිරීමේ විභාගය (නිත්‍ය 2017) සඳහා පෙනීසිට සියලු විෂයන් එකවර සමත්ව දෙවන ස්ථානය හිමිකර ගෙන ඇත. නිළධාරීන් 1488 දෙනෙකු සහභාගී වූ මෙම විභාගයේදී ස්වේච්ඡා බළසේනාවට අයත් නිළධාරියෙකු එකවර සමත් වූ ප්‍රථම අවස්ථාව මෙහෙයවන අතර, මොහුගේ දක්ෂතාවය අධ්‍යක්ෂක ජෙනරාල් පුහුණු ගේ විශේෂ ඇගයීමකටද ලක්විය.

තවද, 2018.01.11 වන දින සිට 2018.04.10 වන දින දක්වා නිළධාරි ප්‍රවර්ධන ප්‍රගමන මධ්‍යස්ථානය බුත්තල වෙතින් පැවත්වූ කණිෂ්ඨ මාණ්ඩලික නිළධාරි පාඨමාලා අංක 13 හැදෑරූ නිළධාරි 32කු අතුරින් ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමටද මෙම නිළධාරි සමත් විය. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් නිළධාරියෙකු මෙලෙස මෙම පාඨමාලාවට සහභාගී වී ප්‍රථම ස්ථානය හිමිකර ගත් පළමු අවස්ථාව මෙය වීමද විශේෂත්වයකි.




යාපනය ආරක්ෂක සේනා ආඥාපතිගේ සංකල්පයකට අනුව රණවිරු සිඟින් ස්ටාර් (SINGING STAR) ඩාන්සින් ස්ටාර් (DANCING STAR) හා ටැලන්ට් ස්ටාර් (TALANT STAR) නමින් රියැලිටි තරඟාවලියක් පසුගිය මාස 6 ක කාලයක් පුරා යාපනය ප්‍රදේශයේ විවිධ ස්ථානයන්හි දී පවත්වන ලදී. එහිදි සිඟින් ස්ටාර් කිරුළ සඳහා තරග වැදුණු තරඟකරුවන් අතරින් තෙවන ස්ථානය හිමිකර ගැනීමට 22 ශ්‍රිලංජාආබමු ඒකකයට අයත් සෙ/22කිපු01090 සාසෙ කුමාරසිංහ පීජීඑම් සමත්විය. 2018.03.29 දින අවසන් මහා තරඟය යුද්ධ හමුදාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් ආරක්ෂක සේනා මුලස්ථානය යාපනයේ දී පවත්වන ලදී.



පාබල පුහුණු මධ්‍යස්ථානය මින්නේරිය වෙතින් 2018.01.06 දින සිට 2018.03.06 දින දක්වා පවත්වන ලද මිසයිල පුහුණු පාඨමාලාව සඳහා නිත්‍ය/ස්වේච්ජා නි/සෙනීන් 10×42 ක් සහභාගි වූ අතර, සමස්ථ පාඨමාලාවේ සෑම අතින්ම දක්ෂතම ශිෂ්‍යාට හිමි කුසලානය 19 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් නි/10675 2/ලුතිතන් එම්පීපීයූ මුතුනායක විසින් හිමිකර ගන්නා ලදී.

# ඒකක අභිමන් සමරමින්...

### 14(සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාව



වැලිඔය ඇතාවැටුණුවැව ප්‍රදේශයේ ස්ථානගත 14(සේවා) ශ්‍රී ලංකා පාබළ හමුදාව සිය 21 වන සංවත්සරය වැ.බ. අණදෙන නිළධාරි මේජර් සී ජයවීර ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැන දෙමින් පසුගියදා සමරන ලදී.

### 5(සේවා) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව



කන්තලේ සීනිපුර ප්‍රදේශයේ ස්ථානගත 5(සේවා) ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුව සිය 38 වන සංවත්සරය වැ.බ, අණදෙන නිළධාරී මේජර් ටීවීආර් පෙරේරා ආර්එස්පී ශ්‍රීලකාහගේ ප්‍රධානත්වයෙන් පසුගියදා අභිමානවත් අයුරින් යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැනක් දෙමින් සමරන ලදී.

### 2 ශ්‍රී ලංකා රයිෆල් බළකාය



ගම්පොල අටබාගේ ප්‍රදේශයේ ස්ථානගත 2 ශ්‍රී ලංකා රයිෆල් බළකාය සිය 11 වන බළඇණි දිනය වැ. බ. අණදෙන නිළධාරි මේජර් ඩබ්ලිව්එම්කේ වීරවර්ධන ශ්‍රීලංරබ ගේ ප්‍රධානත්වයෙන් සමරන ලදී.

### 17(සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාව



සිංහපුර වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගත 17 (සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාව සිය දසවන සංවත්සරය පසුගියදා වැ.බ අණදෙන නිළධාරි මේජර් ජේඊඑල් ද සොයිසා ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැනක් දෙමින් සමරන ලදී.

### 26 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව



යාපනය විඩත්තපලෙයි ප්‍රදේශයේ ස්ථානගත 26 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව සිය 10 වන සංවත්සරය වැ. බ. අණදෙන නිළධාරි මේජර් එස්කේ ගමගේ ගේ ප්‍රධානත්වයෙන් යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැනක් සමරන ලදී.

### පුරෝගාමී බලකා රෙජිමේන්තුව



මෑත කාලීනව ස්වේච්ඡා බළසේනාවට නවක රෙජිමේන්තුවක් වශයෙන් එක් කරන ලද ශ්‍රී ලංකා යුද හමුදා පුරෝගාමී බළකා රෙජිමේන්තුව සිය දෙවැනි සංවත්සරය එහි මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් කේසී ධර්මසේන ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් යුද හමුදා සම්ප්‍රදායන්ට මූලිකත්වය දෙමින් සමරන ලදී.



### 2 (සේවා) ශ්‍රී ලංකා සංඥා බළකාය

වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගත 2 (සේවා) ශ්‍රී ලංකා සංඥා බළකායේ 38 වන සංවත්සරය අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් බීඑම් ජයවීර පීඑස්සීගේ ප්‍රධානත්වයෙන් පසුගියදා අභිමානවත් අයුරින් යුද හමුදා සම්ප්‍රදායන්ට මුල්තැනක් දෙමින් සමරන ලදී.

## දස වසක අභිමන් සමරා





17 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ආරම්භ කර 2017.12.01 වන දිනට වසර 10 ක් සපිරුණි. ඒ නිමිත්තෙන් වූ සංවත්සර සැමරුම අණදෙන නිලධාරී මේජර් කේජීඑන්එස්බී දිසානායක ගේ ප්‍රධානත්වයෙන් ඒකක මූලස්ථානයේදී පැවැත්විණ. එහිදී අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් පිරිනැමීම සියලු නිළ දිවා භෝජන සංග්‍රහය හා බෝධිපූජා පිංකම සංවත්සර කටයුතු අතර ප්‍රධාන තැනක් ගන්නා ලදී. තවද සංවත්සරයට සමගාමීව අභිනවයෙන් ඉදිකළ සුභසාධක ගොඩනැගිල්ලක් විවෘත කිරීමද අණදෙන නිලධාරිගේ සුරතින් සිදුකෙරුණි.





## 14 වසරක
### මතක සැමරුම්


3 වන සන්නද්ධ බුද්ධි බළකාය ආරම්භ කර 2018.04.21 වන දිනට වසර 14 ක් සපිරේ. ඒ නිමිත්තෙන් වූ සංවත්සර සැමරුම වැඩ අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව්එම්ජේකේ කරුණාරත්න ආර්එස්පී අයිඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඒකක මූලස්ථානයේදී පැවැත්විණ.

# විවිධ පුවත්



### ශ්‍රීපාදස්ථානයේ වන්දනා සමය නිමවී...

ලෝකවාසී ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වූ ශ්‍රීපාදස්ථානයේ වන්දනා සමය පසුගිය අප්‍රේල් 29 වන දිනට යෙදී තිබූ පුර පසලොස්වක පෝය දිනෙන් අවසන් විය. ඒ අනුව උඩමළුවේ තැන්පත්කර තිබූ සමන්දේව ප්‍රතිමාව සහ දේව ආභරණ එහි සිට නල්ලතන්නිය විහාරස්ථානය දක්වා වැඩම කරවීමේ පුණ්‍ය මහෝත්සවයට 19 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී මේජර් දමින්ද ගුණවර්ධන ඇතුළු නිලධාරී/සෙනීන් ගේ සහභාගිත්වයෙන් සිදුකරනු ලැබූහ.



# සෙසු නිළ සුබසෙත







ස්වේච්ඡා බළසේනා මූලස්ථානය නවතමයෙන් ගොඩනැගෙන භූමියේ ඉදිකරන ලද සෙසුනිළ භෝජනාගාරය හා මුලුතැන්ගෙය පසුගියදා ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී ගේ සුරතින් සෙසුනිළ අයිතියට පවරා දෙන ලදී. නවීණ අංගෝපාංගයන්ගෙන් සමන්විතව ඉදිකරන ලද මෙම සෙසුනිළ භෝජනාගාරය එකවර 500 කට ආසන්න පිරිසකට පරිහරනය කළහැකි ඉඩකඩක් සහිතව සම්පූර්ණයෙන් වායු සමීකරණය කර තිබීම විශේෂත්වයකි.

එසේම ඉතා වටිනා ගෘහ උපකරණ ඇතුළු තාක්ෂණික මෙවලම් රැසක් ද ඊට එක්කොට ඇති අතර, සැබැවින්ම එය සොබාදහමට අනුකූලව ඉදිකරන ලද දර්ශනීය වූත් සුබෝපභෝගී වූත් ඉදිකිරීමකි. මෙම සෙසුනිළ භෝජනාගාරය විවෘත කිරීමේ අවස්ථාවට සමගාමීව බනි/සැරයන් නිවස්නයක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීමද ස්වේච්ඡා බළසේනා සේනාවිධායකගේ සුරතින් සිදුවිය. මෙම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල් එෆ් කස්තුරිආරච්චි ඇතුළු ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ නිලධාරිහූද සෙසුනිළයෝ රැසක්ද සහභාගී වූහ.

# සුහද එකමුතුවක්...




යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ රාජකාරීන්හි නියුතු නිළධාරීන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුහද එකමුතුවක් පසුගියදා "ලෙෂර් වර්ල්ඩ්" පරිශ්‍රයේදී පැවැත්විණ. ස්වේච්ඡා බළසේනා සේනාවිධායකගේ අදහසකට අනුව සංවිධානය කෙරුණු මෙම කටයුත්ත මගින් එකිනෙකා අතර සුහදත්වය වර්ධනය කිරීමත් ඔවුන්ගේ වෘත්තිය ඒකාකාරී බව මඟහරවාලීමත් අරමුණ විය.






පසුගියදා පළමු වියට පාතැබූ වයි. එම්. **ඉමේෂ් චින්තක හසරැල්** සිඟිති පුතුට සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා ඇතුළු පවුලේ සැම... සෙ/100005 ලා/කෝ සම්පත් කුමාර වයිඑම්එස්



අටවන වියට පා තබන **හිරුන් ටිමේෂ** පුතුට සුහ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම... ස/19ඊ00103 සැරයන් රත්නසිරි යුඑන්ආර් 19(සෙව්) ශ්‍රීලංසිරෙ



හත්වන වියට පා තබන **කවිඳු අංජන** පුතුට සුහ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම... සෙ/19ඊ00103 සැරයන් රත්නසිරි යුඑන්ආර් 19(සෙව්) ශ්‍රීලංසිරෙ



හතර වන වියට පා තබන **දිශේන් දුලාෂ් සහශ්‍රී** පුතුට සුහ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම... ලා/කෝ ජීවන්ත කේඩබ්ආර් 2 (සෙව්) ශ්‍රී ලංකා සංඥා බළකාය



හත්වන වියට පා තබන **සචිනි ප්‍රබෝධ්‍යා මදුශානී** දියණියට හා තෙවන වියට පා තබන **මහේෂි අයෝධ්‍යා මදුශානී** දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම... ලා/කෝ පුෂ්ප කුමාර වයිජීඑස් 18 (සෙව්) ගජබා රෙජිමේන්තුව



දහවන වියට පා තබන **ආර්එම් සහස්නි චලනයනා බණ්ඩාරනායක** දියණියට හා අටවන වියට පා තබන **ආර්එම් නසන්ත ධර්නිත බණ්ඩාරනායක** පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම....
සෙ/ඒ100523 සැරයන් ප්‍රියන්ත බණ්ඩාරනායක ආර්එම් - 5 ශ්‍රීලකාහ



තුන්වන වියට පා තබන **යසිරු නෙත්විඳු බණ්ඩාර රාජපක්ෂ** පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම...
රසෙ රාජපක්ෂ කේපීඑල්
2 ශ්‍රී ලංකා රයිෆල් බළකාය



පසුගියදා දෙවන වියට පාතැබූ **තුහින අනුහස් දිසානායක** පුතුට හා **තුහිර සස්මිඳු දිසානායක** පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම... ලා/කෝ රංග තුෂාර ඩීඑම් 13ශ්‍රීලංජාආබමු.



දෙවන වියට පා තබන **ආර්.එම්.පී.පී. ප්‍රණිපා දුසදි රත්නායක** සිඟිති දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම...
සෙ/කිව්103765 ලා/කෝ අජිත් කුමාර ආර්එම්පීපී
2 ශ්‍රීලංජාආබමු



දහවන වියට පා තබන **යූජී නෙත්මි ඉෂාරා හේරත්** දියණියට සුභ උපන්දින සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම....
සෙ/5ඒ02800 ලා/බො හේරත් යූඩබ්බීඑම් - 5 ශ්‍රීලකාහ



පළමු වියට පා තබන **සනිකි දහම්සා වීරසිංහ** දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම...
සෙ/3ඊ03076 කෝප්‍රල් වීරසිංහ බීජීසී
3(සෙව්) ශ්‍රීලංසිරෙ



පළමු වියට පා තබන **ෂෙනුල් අබිමන් නෙත්සරණ** පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම...
සෙ/ඊ100086 ලා/කෝ කුමාර එම්ඩබ්ලිව්ජී
3(සෙව්) ශ්‍රීලංසිරෙ

# සුභ මොහොතින් නව තනතුරු ලැබ



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ
පුහුණු පරීක්ෂක
**කර්නල් කේපී නුගේගොඩ**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ
කර්නල් පාලන
**කර්නල් අයිඑච්එස් විජේසේන**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ
බඳවාගැනීමේ නිළධාරි
**කර්නල් ඩීඑච්කේඑස් විජේරත්න**
**ආර්එස්පී**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ
කර්නල් පුහුණු
**කර්නල් ඩබ්ලිව්ජීපී සිසිර කුමාර**
**ආර්එස්පී**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ
කර්නල් භකාස
**කර්නල් එම්ඩීබීඑම්එස් ජයමාන්න**



ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය)
කර්නල් සම්බන්ධීකරන නිළධාරි
(සෙව්)
**කර්නල් එල්ඩීබීඑච්එස් ලක්ෂ්මන්**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ
කර්නල් සුභසාධක
**කර්නල් එන්ඩීපී ජයතිලක**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ
කර්නල් ඉංජිනේරු
**ලුතිතන් කර්නල් ආර්එම්ඩී රත්නායක**



22 සේනාංක කර්නල්
සම්බන්ධීකරණ නිළධාරි (සෙව්)
**ලුතිතන් කර්නල්**
**එච්එම්එල්කේ අමුණුගම ශ්‍රීලංසිරෙ**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා පුහුණු පාසල (දිය)
අණදෙන නිලධාරි
**ලුතිතන් කර්නල්**
**එස්එල් ගම්ලත් ශ්‍රීලකාභ**



9 ඉංජිනේරු සේවා රෙජිමේන්තු
වැ.බ. අණදෙන නිලධාරි
**මේජර් එන් වනිගසිංහ එල්එස්සී**



පළමු වියට පා තබන **සිතු සනාය** දියණියට උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම... සෙ/ඊ100579 රසෙ ලහිරු ඩීඑම්එන් 17(සෙව්) ශ්‍රීලංසිරෙ



පසුගියදා පළමු වියට පා තැබූ **ජේඒ යසෙන් මන්තිලක** පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා හා තාත්තා ඇතුළු පවුලේ සැම...



දෙවන වියට පා තැබූ **ඒඑම් ගෝවින්දි අත්තනායක** දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම.... සෙ/2ඊ03551 කෝප්‍රල් මහින්දසේන ඒඑම් - 2 ගරෙ



දෙවන වියට පා තැබූ **චතුර කවීෂ** සිඟිති පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම.... සෙ/සී101170 ලා/කෝ රාජපක්ෂ ආර්එම්පීජීවීඑස් - 2 (සෙව්) ශ්‍රීලංසංබ

# පය ඇඳි බිම
# ළය රැඳි මතක

දශක තුනක යුද්ධය නිමවී වසර 10 කට ආසන්නය. නිදහස හා සාමයේ ප්‍රතිලාභ භුක්ති විඳිමින් සමස්ථ රටවැසියන්ම සිය ජීවන අරගලයන්හි නිරතව සිටින අතර තුර රණවිරුවෝද එතෙක් කළක් තම අතරැඳි ගිනි අවි පසෙකලා නිහඬ මෙහෙවරක නියැලී සිටිති. එවක සටන් පැවති උතුරු නැගෙනහිර බිම්කඩ පුරා ඇරඹි සංවර්ධන සංග්‍රාමයේ ප්‍රතිඵලයෙන් එහි පෙර වූ යුද්ධයේ නටඹුන් සහමුලින්ම මැකී ගොස්ය.


සියල්ල එසේ වුවද රණබිමෙහි මානුෂිය ගුණ රැඳි මතක සටහන් එලෙස මැකී යා නොදී සමාජගත කිරීම කාලීන අවශ්‍යතාවක් සේ හැඟේ. රණවිරුවන් සතුව තිබූ වීරත්වය, දේශානුරාගය, බිය සැක දුක වේදනාව සතුට හමුවේ ඔවුන් ජීවිත වලට මුහුණ දුන් අපූරුවද එකී මතක සටහන් විශ්ලේෂණය කිරීමේදී කදිමට විද්‍යාමානවේ. “පය ඇඳි බිම ළය රැඳි මතක” තුළින් දිගහැරෙනුයේ එදවස රණබිමේ සැඟවුන සුන්දර කතන්දරයි...

නැගෙනහිර පළාතේ වාලච්චේන ප්‍රදේශයේ වූ අනුකණ්ඩයක එවක මා සේවය කළ අවදියයි. 90 දශකයේ මැද භාගය වූ එම කාලපරිච්ඡේදයේ මා ලුතිතන් නිළයේ පසු විය. එකළ අද මෙන් ජංගම දුරකථන හෝ අන්තර්ජාල පහසුකම් කිසිවක් නොවූ අතර ඒවා පිළිබඳ අසා තිබුනේ ද නැත. හදිසි අවස්ථාවක තම නිවසට දුරකථන ඇමතුමක් ලබා ගැනීමට පවා යාබද පිහිටි අප මූලස්ථාන කඳවුරට යායුතු වූ අතර ඒ සඳහාද අවම වශයෙන් කිලෝ මීටර් 20 ක් වත් මග ගෙවීමට සිදුවිය. ඉහත සියලු තත්වයන් හමුවේ ක්‍රියාන්විතයන්හි නිරත සෑම සෙබළෙකුම සතුව තිබූ එකම සන්නිවේදන මාධ්‍යය වුයේ ලිපි ගනුදෙනුය.

ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් බහුලව පැවති එකළ දිනපතා කුමන හෝ බිහිසුණු සිදුවීමක් අවටින් වාර්ථා විය. එකළ මා යටතේ වූ අනුකණ්ඩයේ වැඩි සෙබළ පිරිසක් නොවූවද ඔවුනගේ රාජකාරි හා පුද්ගලික අවශ්‍යතා විමසා බැලීමද, කඳවුරෙහි හා සෙබලුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ගතහැකි ක්‍රියාමාර්ග ගැනීමද මාවෙත පැවරී තිබුණි. එනිසාම මා සිටි කඳවුර වටා පිහිටි ආරක්ෂක වළල්ලෙහි මුර රාජකාරීන්හි යෙදී සිටින සෙබලුන්ගේ දුකසැප සොයා බැලීම එවක මා විසින් නිරන්තරව සිදුකළ කටයුත්තකි. විශේෂයෙන්ම සවස් කාලයේත් රාත්‍රී කාලයේත් සෑම බංකරයක් වෙතම ගොස් ඒවායේ ආරක්ෂක තත්වය පිළිබඳ පරීක්ෂා කිරීම අනිවාර්යයෙන් සිදුකරන ලද්දේ ප්‍රදේශයේ ත්‍රස්තවාදී තර්ජන එතරම්ම බහුලව පැවති හෙයිනි.

එක්තරා දිනක සවස් කාලයේ මා එලෙසින් කඳවුර වටා ඇවිදිමින් එහි ආරක්ෂක කටයුතු පිළිබඳ සොයා බලමින් සිටින අතරතුර හදිසියේ





# සෙනෙහසට ඉනු කඳුළු...

ඇඳහැලුණු වර්ෂාවක් හේතුවෙන් අසල වූ බංකරයක නතරවිය. තද සුලඟක් හා මුසුව ඇද හැලුණු එම වර්ෂාවෙන් ප්‍රදේශයම තෙත බරිත වීමට එතරම් වේලා ගත නොවුණි. ඒ අවස්ථාවේ මා රැඳී වුන් බංකරයේ සෙබළෙකු යමක් කියවමින් සිටි අතර දිරාගොස් තිබූ එහි වහලය මතින් රුරා වැටි වැහි බිඳු වලින් ඔහුගේ ලිපිය සම්පූර්ණයෙන්ම තෙමී යන්නට විය. මා දුටු සැනින් අපහසුතාවයකට පත් වූ ඔහු නැගී සිටින්නට වූයේ ලිපිය සිය කලිසමෙහි යාන්තමට පිසදමමිනි. සිය ලිපිය තෙමී යාම හේතුවෙන් ඔහු බොහෝ සෙයින් කණගාටු වී ඇති අයුරකි. එසේම මාගේ පැමිණීම හේතුවෙන් හෙතෙම තරමක් ලැජ්ජාවට පත්වූ ආකාරයක්ද පෙන්නුම් කලේය. එනිසාම එම ලිපිය ඔහු සුරතෙහි ගුලිකර ගැනීමට උත්සාහ ගනිද්දී මා ඒ පිළිබඳ ඔහුගෙන් විමසීය.

ඒ වන විට මාස කිහිපයකින් නිවාඩු නොගොස් සිටි ඔහු වෙත එය සිය පෙම්වතියගෙන් ලද ලිපියකි. ඔහුගේ ලිපිය කියවීම මා විසින් සිදු නොකළ යුත්තක් බැවින් එහි අඩංගුව තිබුණු තොරතුරු පිළිබඳව පමණක් මා ඔහුගෙන් විමසන්නට වූයේ ඔහුට කිසියම් වෘත්තීය හෝ පුද්ගලික ගැටළුවක් වීනම් ඔහුව භාරව සිටින නිළධාරියා ලෙස ඊට විසඳුම් ලබාදීම මා සතු වගකීමක් වූ බැවිනි. "මේ දනුයි ලියුම අතට ලැබුණෙ සර්... තාම සම්පූර්ණයෙන් කියවන්න බැරිවුනා" ඒ ඔහුගේ පිලිතුරයි.

බොහෝ පෙම්වතුන් තම පෙම්වතියන් හා දොඩමළුවන යාමයක ක්‍රියාන්විතයෙහි නිරත සෙබළෙකුට ඒ සඳහා ලැබෙනුයේ සාපේක්ෂව ඉතා සීමිත ඉඩකි. එහිදීද වැඩිපුර ලංවනුයේ ගතින් නොව සිතිනි. නමුත් වැහි බිඳු ඔහුගේ අහිංසක පෙමට සිතින් හෝ සමීපවීමේ ඉඩකඩ අසුරා ඇත්තේ කෙතරම් අවාසනාවන්ත අයුරින්ද. වර්ෂාව තුරන් වත්ම මා බංකරයෙන් නික්මුනේ පෙරකී සිදුවීම පිලිබඳව මාතුළ උපන් පහන් හැඟීමෙනි. එදින රාත්‍රියේ මා එකී සිදුවීම ඔහුගේ කෝණයෙන් බලා මෙලෙස අකුරු කරන ලද්දේ ක්‍රියාන්විත බිමෙහි ප්‍රේමය හමුවේ පීඩා විඳි සියලු රණවිරුවන්ගේ පැතිකඩක් ඔහු හරහා ගම්‍ය වන බැවිනි.

දෙමාසෙක විරාමය මකාගෙන ආ හසුන
සිරකරන් අත් දෙකෙන් බංකරය වෙත රැගෙන
නුඹෙ සොඳුරු අත් අකුරු මතකයෙන් දැන හැඳින
දෙතොල් මත තබා සිඹ සැනසුනේ මුළු හදින

වස්සාන සමයකදි කිරි ගැහෙනා සීත
එක කුඩේ යට ඉඳන් පා නැගූ දින ඈත
ගම් දුරස් උනත් අපි හිත්වලින් ලඟ පාත
පැතුම් කොතරම් වේද අරගන්න ඔය දෑත

විවරකළ පෙම් හසුන කියවන්න සැරසිලා
ළය රැඳුණු සෙනෙහසින් දෑස් විකසිත වෙලා
අත රැඳුණු ගිනි අවිය මොහොතකට ගොළුවෙලා
බංකරේ වහලෙ යට අපි දෙන්න තනිවෙලා

සුවඳ ගැල්වූ කොලේ පේලියට අකුරුකර
පුංචි මල් දෙකක් ඇඳ ඒ මැදින් එකතුකර
ජීවිතේ පුරාවට හැර නොයන ලෙසින් ඉර
ලිපියෙ ඉහලින් ලියා "නුඹ මගේ සෙනේබර"

කල්පනා ලෝකයක අත් බැඳන් හරි අගේ
දුර ඈත පියඹන්න පිනක් නැතුවා වගේ
හදිසියේ හමා ආ සුළං රැල් මග දිගේ
නුඹෙ ලිපිය ඉරී ගොස් දැහැන් බිඳුනා මගේ

බංකරේ වහලෙ මත පුංචි සිදුරක කොනින්
වැහි බිංදු ගලා විත් වැටී කොළයට සෙමින්
බොඳ උනා මුතු අකුරු දිය උනා මුදු වදන්
ගෙනේවිද සෙනෙහසක විරාමය ඒ ලෙසින්

නුඹෙ මුහුණ දැකගන්න නිවාඩුව දුරස්වී
එවි හසුන කියවන්න පොද වැස්ස හරස්වී
සෙනෙහසට ඉනු කඳුළු සෝ සුසුම් ගඟක්වී
ගලා යයි නෙතු අගින් නුඹෙ පහස මතක්වී

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ

# විශිෂ්ටයන් අතර



මේ වන විට ජාතික තලයේ ජයග්‍රහණ රාශියකට උරුමකම් කියන ජූඩෝ ක්‍රීඩකයෙකු ලෙස 24 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් සෙ/කියු104695 සාසෙ සුරවීර කේඑල්එස්එම් හඳුන්වාදිය හැක.

2015, 2016 වසර වලදී කිːග්‍රෑ 50 බර පන්තියද, 2017 වසරේදී කිːග්‍රෑ 55 බර පන්තියද නියෝජනය කරමින් අන්තර් රෙජිමේන්තු ජූඩෝ තරගාවලියට සහභාගි වී ප්‍රථම ස්ථානය හිමි කරගත් සාසෙ සූරවීර, 41 වන ජාතික මහා ක්‍රීඩා උළලේ දී කිːග්‍රෑ 50 බර පන්තියේ දෙවන ස්ථානය ද, හිමිකර ගෙන ඇත. තවද 2016 ආරක්‍ෂක සේවා ජූඩෝ තරගාවලියේ දී කිː ග්‍රෑ 50 බර පන්තියේ ප්‍රථම ස්ථානයත්, 43 ජාතික මහා ක්‍රීඩා උළෙලේ දී කිːග්‍රෑ 55 බර පන්තියේ දෙවන ස්ථානයත්, හිමි කර ගත් ඔහු 24 වන ජාතික ක්‍රීඩා උළලෙට සහභාගී වී කිːග්‍රෑ 55 බර පන්තිය සඳහා ප්‍රථම ස්ථානය ද හිමිකර ගනිමින් යුද හමුදාවට ඉමහත් කීර්තියක් රැගෙන ඒමට සමත්ව ඇත. රෙජිමේන්තු, යුද හමුදා හා මධ්‍යම පළාත්, වර්ණ ලාභි ක්‍රීඩකයෙකු ද වන සාසෙ සුරවීර අන්තර් ජාතික තලයේ ජයග්‍රහණයන් ගෙන ඒමට සමත් පෙර නිමිති මේ වන විට පෙන්වා ඇත.



ස්වේච්ඡා බළසේනා පුහුණු පාසල වෙතින් පැවැත්වූ පරිගණක පාඨමාලා අංක 18 හදාරා එහි ඒ සාමාර්ථයක් ලබා ගනිමින් ප්‍රථම ස්ථානය හිමි කර ගැනීමට 13 ශ්‍රීලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවට අයත් සෙ/කියු108572 සාසෙ උදයසිරි ඊආර්ඩබ්ලිව් සමත් විය. තවද එහි තවත් විශේෂත්වයක් වනුයේ එම පුහුණු පාසලේ පාඨමාලාවේ ආරම්භයේ පටන් පාඨමාලා අංක 18 දක්වා ඒ සාමාර්ථයක් ලබා ගත් පළමු සෙනියා ද මොහු වීමය.



දොඹගොඩ පිහිටි යුධෝපකරණ පුහුණු පාසල වෙතින් පැවැත්වූ උපකරණ පාලන ජ්‍යෙෂ්ඨ කොනොනි පාඨමාලව සඳහා සහභාගී වූ 4 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුලුවට අයත් සෙ/4කියු02036 මාණ්ඩලික සැරයන් ප්‍රසංග ආර්ජේ ජ්‍යෙකොනොනින් 38 දෙනෙකු අතුරින් දෙවන ස්ථානය හිමිකර ගෙන තිබේ.



ආරක්‍ෂක සේනා මූලස්ථාන (නැ) ආඥාපතිගේ සංකල්පයකට අනුව පැවත්වූ අන්තර් සේනාංක පාපන්දු තරඟවලියේ දී 22 සේනාංක කණ්ඩායම නියෝජනය කළ 24 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවට අයත් සෙ/24කියු00679 සාසෙ නන්දපාල වයිජීඑස් දක්‍ෂතම ප්‍රහාරකයා ලෙසත්, සෙ/කියු108975 සාසෙ වීරසිංහ එච්එච්පීඩීඑස් තරගාවලියේ දක්‍ෂතම ක්‍රීඩකයා ලෙසත් සම්මාන ලැබූහ.

## ලොව ජයගත හැකි විරු පුතෙක් ....





ආසේමු (යා) ආඥාපතිගේ සංකල්පයකට අනුව එම බළප්‍රදේශයේ ස්ථානගත සේමු, බසේමු හා ඒකක වල සිටින යුද්ධ හමුදා සාමාජිකයින් තුළ නිර්මාණාත්මක කුසලතාවයන් වැඩි දියුණු කිරීමට හා ඒ සඳහා දක්වන කැපවීම අගය කිරීමේ අරමුණින් යුතුව නව නිපැයුම් නිර්මාණ ප්‍රදර්ශණයක් පවත්වන ලදි.

එහිදී තරඟාවලියට එක්වූ 50 කට අධික සේමු/බසේමු හා ඒකක අභිබවා 12 (සෙව්) විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් නිර්මාණශිලි සෙබළෙකු වන සෙ/12එච්00734 කෝප්‍රල් පුෂ්පකුමාර එච්පීටී කොනොනි විසින් ඉදිරිපත් කරන ලද "වැඩිදියුණු කරන ලද ආරක්ෂිත වාහන අසුන් බඳ පටිය" වෙනුවෙන් එහි ප්‍රථම ස්ථානය හිමි විය.

ඔහු විසින් නිපදවූ අදාල බඳ පටිය මගින් රියදුරුට ආසන පටිය පැළඳීමකින් තොරව රථය පන ගැන්වීමට නොහැකිවන අතර රථයේ වේගය පැ.කි.මී 10 ට වඩා වැඩි වේගයකින් ධාවනය කිරීමේදී ආසන පටිය ඉවත්කිරීමටද නොහැකිය. එසේම එය ස්වයංක්‍රීයව අගුළු වැටෙන අතර , වේගය පැ.කි.මී 10 දක්වා අඩුවන අවස්ථාවේදී  ආසන පටිය ඉවත් කිරීමට හැකියාව පවතී. තවද වාහනය පනගන්වා ආසන පටිය ඉවත් කල හැකි බඳ පටිය පැලදීමකින් තොරව වාහනයේ වේගය පැ.කි.මී 10 ඉක්මවා ධාවනය කිරිමට නොහැකි වන පරිදි එය නිර්මාණය කර තිබීමද විශේෂත්වයකි.

තත් කොනොනිගේ එම ජයග්‍රහණය වෙනුවෙන් 2018.05.22 වන දින ආසේමු (යා) ආඥාපතිගේ ප්‍රධානත්වයෙන් කුසලානය, සහතික පත හා රුː 75000.00 ක වටිනාකමින් යුතු මුදල් ත්‍යාගයක් ද හිමිවිය.

(4 පිටුවෙන්)

# විශේෂ කුසලතා හා කුසලතා සම්මාන ලැබූවන්



නි/8368 ලුතිතන්
එල්පීපීඩීඑන්කේ කුලතුංග 4 ශ්‍රීලයුකාබ
**(නව නිපැයුම්)**



සෙ/කියු109572
බනි II නලින් කුමාර පීඩීඑන්
**(නව නිපැයුම්)**



සෙ/කියු107078
සාමාන්‍ය සෙබළ ජීවන් ආර්එම්
**(නව නිපැයුම්)**



සෙ/7කියු02867
ලාන්ස් කෝප්‍රල් ගොඩවත්ත ඒජීසී
**(මූර්ති)**



සෙ/4එස්00671
ලාන්ස් කෝප්‍රල් පෙරේරා කේසීඑන්
**(වාදන)**



සෙ/10එෆ්01037
සැරයන් වීරසිංහ කේඑම්
**(වාදන)**

# කුසලතා සම්මාන ලැබූවන්



සෙ/7එස්000771
ලාන්ස් කෝප්‍රල් තිලකරත්න එච්එස්
**(ගායන)**



සෙ/14කියු01359
ලාන්ස් කෝප්‍රල් කුරුප්පු යූකේඑල්එල්
**(ගායන)**



සෙ/19ඊ00254
කෝප්‍රල් ගුණරත්න ඩබ්ලිව්එම්පී
**(සැන්ඩෝ දර්ශන)**



සෙ/7එස්00130
කෝප්‍රල් හේමවරුන ආර්කේඑම්
**(නිවේදන)**




සෙ/10එස්00176
ඉසෙ ලක්සිරි ඒබීආර්එම්
**(මැජික්)**



සෙ/එම්100069
ලාන්ස් කෝප්‍රල් බංඩාර ඩබ්ලිව්එම්සී
**(නව නිපැයුම්)**

## රණවරුණට

### ඔබේ ලිපි නිර්මාණ ඕනෑ



යුද හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය මගින් ප්‍රකාශයට පත්කරණු ලබන " රණවරුණ" සඟරාව වර්තමානයේ යුද හමුදාව තුළ ඉහළම ජනප්‍රියත්වයක් දිනා ඇති සඟරාව බව නිරතුරු අප වෙත ලැබෙන ලිපි හා දුරකථන ඇමතුම් මඟින් සනාථ වේ. එබැවින් ''රණවරුණ'' එම තැනට ඔසවා තැබූ ඔබ සැමට අපගේ ගෞරවණීය ආචාරය මෙලෙස පුදකෙරේ.

ස්වේච්ඡා බළසේනාවට අයත් ඒකකවල තොරතුරු හා එහි සාමාජික, සාමාජිකාවන්ගේ නිර්මාණාත්මක හැකියාවන් සඳහා වැඩි ඉඩකඩක් මෙම සඟරාව තුළ වෙන්කලද බොහෝදෙනෙකු ඉන් උපරිම ප්‍රයෝජන නොගන්නා බැව් නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම බොහෝ ඒකක නිරතුරු අප වෙත ලිපි නිර්මාණ යොමු කළද ඇතැම් ඒකක එසේ ලිපි නිර්මාණ එවනු ලබන්නේ ඉතා කලාතුරකිනි. ඒ අතරින්ද කිසිදු තොරතුරක් යොමු නොකරන ඒකකද වේ. සෑම ඒකකයක්ම පාහේ නිරතුරු ඉතා වැදගත කටයුතු ඕනෑ තරම් සිදුකරනු ලබයි. එහෙත් එම තොරතුරු මෙම සඟරාව වෙත ලබා නොදීම හේතුවෙන් ඒ පිළිබඳ කිසිවෙකු දැනුවත් නොවන තත්වයක් මතුවේ. එබැවින් ඒ පිළිබඳ අවධානය යොමුකර ඒකකය තුළ සිදුවන වැදගත් තොරතුරුද සෙබළ සෙබළියන්ගේ නිර්මාණද නොපමාව අපවෙත යොමුකරන්න.

# බීලා ගෙදර නොගිය රැයක්...



අද අරක්කු වල මිල අධික කම නිසා සූර් වෙන්න බොන්න ලොකු මුදලක් වියදම් වෙයි. එසේ මිල අධික මුදලක් ගෙවා දුකසේ ලබා ගන්නා සූර් එක බිංදුවට බහින සේ සූර්වී ගෙදර යන පෙම්බර සැමියාට සැරෙන් කථාකරන භාර්යාවන් කරන්නේ ජාතික අපරාධයකි.! නියම භාර්යාවකගේ යුතුකම වනුයේ සැමියා වියදම් කර නංවාගත් සූර් එක ඒ මට්ටමින්ම තබාගෙන සිටීමට උපකාරී වීමයි. මේ සිද්ධාන්තය නොදන්නා තම භාර්යාවන්ට සාප කරමින් සයිමන් බාර් එකේ සිට වැනි වැනි ගෙදර ආයේය.

''ඇයි මෙච්චර කලින් ගෙදර ආවේ ? තවම රෑ එකොළහයිනේ වෙලාව? තව ඉන්න එපැය! බිරිඳ සැර වූවාය.''

''කොහේ ඉන්නද උං බාර් එක හරියට රෑ දහයට වැහුවානේ ! මං කිව්වා ඕල්ටයිම් කරපල්ලා. මං අවශ්‍ය ප්‍රතිපාදන සලසා දෙන්නම් කියලා. ! කොහෙද ? ඔහු සිතෙන් තම බිරිඳට ශාප කලේය. උගේ බිරිඳද තම බිරිඳ මෙන් ප්‍රමාද වී ගෙදර එන විට සැර කරනවා විය හැකිය.''

''දහයට වැහුවා මම මේ මඟ බලාන ඉන්නවා ඉහි ! ඉහි ! ඈ අඬන්නට වූවාය.''

''නොහඩන් ලඳුනේ නොහඬන් ලඳුනේ , බාර් යථා පරිදි හෙට උදේට අරිනු ඇත.''

''බාර් එකේම බුදියගන්න එකයි තියෙන්නෙ.''

''බැඳලා මාසයක් වෙනවා! තවම එක දවසක් නොබී ගෙදර අවායෑ?''

''අපේ පරම්පරාවේ කෙනෙක් බොන්නේ නෑ.''

''ආ... එහෙනං දූන්ද පරම්පරාවෙ අයගේ අඩුපාඩු තේරෙන්නේ ?''

''මට බෑ මේ දීග කන්න. මං ගෙදර යනවා.!''

''වෙරි ගුඩ්..... මං හංදියේ ත්‍රීවිලර් එක ඇරං එන්නද?''

''ඔව් කැමති වෙයි.... මෙතන තනියෙන් නාඩගම් නටන්න. පඩි ඉවරවෙනකං බීලා ! මං බොන්නේ පඩියෙන් නෙවේ. මට ඔයාලා පප්පගෙන් ලැබුණ දෑවැද්දෙන් ! මේ මාසෙට ලක්‍ෂ දෙකහමාරේ දෑවැද්දෙන් පනස් දාහක් ඉවරයි. මගෙ මාමණ්ඩි බුදු වෙන්න ! මට උන්දෑ ජාති ජාතිත් වසානාවන්. දුව නැතිව !''

''මං නැතිවෙනවානම් අශා ඇති ! මට ඔයා ඔනෑ.... ඔයා හිංදනේ දෑවැද්ද ලැබුනේ ! ආන්න පිරිමියෙකුට දෑවැද්ද අවශ්‍ය බොන්න. නොබී ගැහැණියෙක් නඩත්තු කරන්න බැහැ. අලියා බලා ගන්න මිනිහා බොනවානම්, ගෑනියක් බලා ගන්න මිනිහා බොන්නේ නැතිව පුළුවන්ද? අලියානං කොටං හරි අදිනවා. ගෑනි මොනවද අදින්නෙ? බාල්දි ! බාල්දි ! යැයි කියවමින් සයිමන් කොට්ටය මත හිස තැබීය.''

''මං මේ අන්තිම වතාවටයි කියන්නේ. මීට පස්සෙ ඔන්න බීල ගෙදර එන්නෙ නැහැ !''

''හ්ම් ! ඔහු නින්දෙන්ම එකඟ විය. පසුදා යළි රාජ්‍ය ඩෝ සංස්ථාවේ සිය සුපුරුදු රැකියාව සඳහා ගෙදරින් පිටවූ සැමියා වන සයිමන් බොනපාට්ට බිරිඳ සිය හය වන ශික්ෂාපදය මතක් කළාය. ඔන්න අදනම් බීලා ගෙදර එන්නේ නෑ ! මං අදනං කීයයි කිව්වත් බොන්නේ නෑ යැයි

දැඩි ආත්ම විශ්වාසයකින් යුතුව වැඩ ඇරී ගෙදර එන විට බාර් එක ළඟදී අහක බලාගෙන ආවේය. හංදියේ සිංහල බෙහෙත් සාප්පුව ළඟ සෙනෙග ටිකක් වැඩියෙන් ඇත. මදුර සංගීතයක්ද ඇසේ. ඉදිරිපස සරසා ද ඇත.''

''ආ... එන්න ! එන්න මිස්ටර් බොනපාට් ! විවෘත කරන උත්සවයට ආරාධනා කරන්න වේලාවක් තිබුණේ නෑ. අද පළවෙනිදා මයෙ ගානේ කියමින් බෝම්බ මහතුන් සයිමන් ඇදගෙන ගියේය. සයිමන් බෝඩ් එක බැලීය. ජනහිත වයින් ස්ටෝර්ස් යනුවෙන් මොහොතකට කලින් සුභ මොහොතින් විවෘත වූ රට බීම සාප්පුවේ නාම පුවරුව බලා සයිමන් පුදුම විය.''

''මේක ඊයේ මෙතනතිබුණේ නෑ. ඊයේ වෙනකම් මෙතන තිබුණේ සිංහල බෙහෙත් සාප්පුව ! ඔය බෙහෙත් මේ කාලේ ශරීරවලට අල්ලන්නේ නෑ. ඒක ඊයේ වහලා දැම්මා. මම අද ඇරියා රට බීම සාප්පුව. අපේ හිටපු මන්ත්‍රී තුමා මළාට පස්සේ ඊයේ ඒ වෙනුවට දිවුරුම් දුන්න ඊළගට වැඩිම මනාපෙ තියෙන මගෙ මස්සිනා ! දිවුරුම් දුන්න හැටියම එයාට ලිකර් පර්මිට් දෙකක් හම්බවුනා. අද ඇරියා ලිකර් ෂොප් එක. කොහොමද අපේ වැඩ කිඩ ! හා යං ! යං ! අද මයෙ ගානේ!''

''මිසිස් නං කීවේ අද බීලා එන්න එපා කියල !''

''ඒ සල්ලි වලටනෙ ! මේක මයෙ ගානෙනිකං

හම්බවුණා කිවුවම ප්‍රශ්නයක් නෑ.''

ගල් හා පොල් වලින් පදමට සංග්‍රහය ලැබූ සයිමන් බෝම්බ මහතුන්ට බුදුබව අත්වේවායි ප්‍රාර්ථනා කරමින් රාත්‍රී 9.32 ට රාහු කාලය ගෙවා අළුත් රට බීම සප්පුවෙන් ගෙදර බලා පිටත් වූයේය. අන්ධකාරයේ ඔහු ඉදිරියෙන් මැවී පෙනෙන්නට වූයේ සිය බිරිඳගේ මුහුණය. ඔහුගේ දෙසවනේ රැව්පිළිරැව් දෙන්න වූයේ ඇය විසින් පනවන ලද එකළොස්වන පනතය. භය වන ශික්ෂා පදයයි !

''අදනම් බීලා ගෙදර එන්න එපා !''

වැසි පොද වැටෙන්නට විය. වීදියේ පහන් ආලෝකයද දුර්වලය. ළඟ වූ ගෙයක පිලට ගොඩවූ ඔහු ගෙදර ගිහින් කිවයුතු නිදහසට කාරණය ගැන සිතන්නට වූයේය.

ජනේල පියන විවෘත විය. "කවුද" කියා ගෙයි උන් කාන්තාව ජනෙල් පොලු මුහුණ මැදට තදකර ඇසුවාය.

''මම''

''මම කියන්නේ ?''

''මම කියන්නේ උත්තම පුරුෂ ඒක වචන සර්වනාම පදයක් ! හරිද ?''

''මට ව්‍යාකරණ උගන්වන්න ඕනේ නෑ. මට දැනගන්න ඕනේ මගේ මහත්තයා නැති අතරෙ ඒ බව දැනගෙන කව්ද මේ ගේ ළඟ හොල්මන් කරන්නේ කියලා.''

''මං හොල්මන් කරන්නේ නෑ. මං මේ වැස්සට ගොඩ වුණා.''

''දූන් වැස්ස පෑයියා නේ... ?''

''ඒ උනාට ගෙදර යන්න බයයි. ඒ මොකෝ ?''

''මිසිස් උදේ කීවා බීලා ගෙදර එන්න එපා කියලා. ඉතින් මං මේ සූර් බහිනකම් ප්‍රමාද වෙනවා.''

''ඇයි ? මිසිස් කැමති නැහැ මං බොනවට ! ඔයා බීලා පිඟන් කඩනවද ? බනිනවද ? එයාට ගහනවද ? කුණු හරුප කියනවද ? සන්ඩුසරුවල් කරනවද ?''

''ඒ මොකවත් නැහැ. චූන් එකේ ඉඳලා එයාට තරහා නිවුනයින් පස්සේ ආදරය කරලා නිදාගන්නවා.''

''පිලේ ඉන්න එපා. ! කියා ඈ ජනේලය දඩාස් ගා වසා දැම්මාය. ''

''එන පොට හරි නැති බව වටහාගත් ඔහු පාරට බහින්න සූදානම් වන විට හුළං වදින්න හොඳනෑ.... ගෙට එන්න කියා ඈ දොර ඇරියාය.''

සයිමන් බයෙන් ගෙට ගොඩවී ආසනයක වාඩි වූයේය.

''මගේ මිනිහත් හරියට බොනවා. නොබොන දවසක් නෑ. පෝරුවට නැංගෙත් බීලල ගෙදර ඇවිත් මට බනිනවා ! ගහනවා ! මගෙ කෙස් වැටියෙන් අල්ලගෙන අඹරලා බිම දානවා ! පිඟන් කෝප්ප පොඩි කරනනවා ! කුණු හරුප කිය කියා මාව මරන්න හදනවා. කොටින්ම කියනවානම් බැන්දයින් පස්සේ මං ගුටි නොකා ඉන්න එකම දවස අදයි. ඈ අඬ අඬා කීවාය.''

''ඇයි ?''

''අද එයා ගෙදර නහැ. බීලා පාරෙදි සණ්ඩුකරලා අද පොලීසියේ ලකප් එකේ ! හෙටයි ඇප දෙන්නෙ. මං මේ අද දවස ගත කරන්නේ කොහොමද කියලා දෙයියන්ට කිය කියා හිටියේ ! දෙයියො මගේ මුහුණ බලල ඔයා මෙහාට එව්වා. අද ගෙදර හොඳටම පාළුයි. කුණු හරුප ඇහෙන්නෙත් නෑ. පිඟන් කෝප්ප කැඩෙන සද්දේ නෑ. මට ඔක්කොම ඉවසන්න පුළුවන්....... ගුටිනොකා ඉන්න බෑ.... ඇඟ රිදෙනවා වගේ ! අනේ දූං ඔයා බීලා ඉන්න එකේ මට ගහන්න ! මගෙ කෙස් වැටියෙන් අල්ලගෙන මාව බිම දාගෙන පාගන්න. ඔය රත්තරං අත්දෙකින් මගෙ බෙල්ල මිරිකන්න !

මට බෑ..... මං ඕවා කරන්නේ නෑ ! සයිමන් පසුබසින්නට විය.

''හරි.... බීලා මදි ඇති ! ආ මගෙ මිනිහගෙ බෝතලෙයි, වීදුරුවයි. ! ඇති තරං බීල මං ඔයාගෙ ගෑනි කියල හිතාන මට පහර දෙන්න !''

සයිමන් බෝතලය හිස් කරන්නට විය. බොන්න බොන්න ඇගේ රූ ලස්සන ඔහුට පෙනෙන්නට විය.

''මං කොච්චර බීවත්, ගහන්නේ බනින්නේ නෑ.! මට පුරුදු ආදරේ කරල !''

''ඒ කොහොමද? මං එහේම දෙයක් දන්නේ නෑ ! මං දන්නේ මිනිහා බීවම ගෑණි ගුටිකන්න ඕනෑ කියලා !''

සයිමන් ඇය තුරුළු කරගෙන ආදරය කරන සැටි ඇයට පෙන්නා දුන්නේය.

''ආනේ.... ගුටි කනවද වැඩිය ... බැනුං අහනවට වැඩිය, කොච්චර ජොලි දෙයක්ද ආදරය කරන එක ! මං ඔයාට යන්න දෙනනෙම නෑ කියා ඈ ඔහුට තව බොන්න දී නතර කර ගත්තාය.''

ඩන්කර් සටනින් පරාජය වී ගෙදර බලා යන සොල්දාදුවෙකුසේ පසුදා උදේ පාන්දර සයිමන් ගෙදර බලා ගියේය.

''ඇයි ඊයේ ගෙදර ආවේ නැත්තේ ! බිරිඳ සැරට වඩා දුකින් ඇසුවාය. මං කන්නෙත් නැතිව නිදිමරාගෙන එළිවෙනකං බලං හිටියේ !''

''ඇයි ඔයා මනේ කීවේ මට බීලා ගෙදර එන්න එපා කියලා ! ඉතිං මං බීලා ගෙදර නැත් හිටියා !''

''කොයිද හිටියේ !''

සයිමන් කවදාවත් බොරු නොකියන අයෙකි. ඔහු තමා රය ගත කළ හැටි විස්තර කර සිටියේය.

''බිම පෙරළෙමින් හඬන්නට වූ සයිමන්ගේ බිරිඳ, මීට පස්සේ බිව්වා උනත් කමක්නෑ ගෙදර එන්න ඕනෑ !''

කියා එකලොස් වැනි පනත හෙවත් ශික්ෂාපදය සංශෝධනය කළාය.

**චන්ද්‍ර අගනිරත්නගේ**

**" නරලොව හොල්මන් 2 " කෘතිය ඇසුරෙනි.**





# එම්.බී.ටී. චිපය

## (මෙන්ටල් බ්ලුටූත්)

**කෙටි කතාව**

රෙදි සාප්පුවට ඇතුළු වීමට පෙර එහි දොරකඩ අබියසදී මම වටපිට බලා කාටවත් නොපෙනෙන සේ "එම්.බී.ටී" හෙවත් " මෙන්ටල් බ්ලුටුත් " චිපය සහිත පුන නූල කරවටා දමා ගතිමි. එය මාලයක් සේ කමිසය ඇතුලත නිරාවරනය වූ පපුවේ හරි මැදට සවිවන සේ සකස් කරන ලද්දකි. මෙම "එම්.බී.ටී" චිපය සහිත මාලය පැළඳගත් ලෝකයේ පලමු පුද්ගලයා මම නොවෙමි දැයි සිතන විට මාගේ සිත මහත ආහ්ලාදජනක හැඟීමකින් පිරී යයි. වසර කිහිපයක් පුරා පර්යේෂණ කරමින් මෙම "එම්.බී.ටී" චිපය නිපදවූ මහාචාර්ය දොළපිහිල්ල පැවසූ වදන් මට මේ මොහොතේ සිහිපත් වේ. විමුක්ති හොදට මතක තියා ගන්නවා තාම මේක මුළුලෝකෙටම රහසක්. මම තමුසෙව දීර්ඝ ලෙස පරීක්ෂා කරලා තමයි මේ චිප් එක තමුසෙට දෙන්නේ. ඒක පපුවේ හරි මැදට ස්පර්ශ වෙන්න තියා ගත්තම තමුසෙට පුළුවන් ඕනෑම පුද්ගලයෙකුගේ අතේ මැණික් කටුව ලගින් අල්ලගෙන ඒ පුද්ගලයාගේ ඒ වෙලාවේ සිතුවිලි මේ චිප් එක හරහා දැන ගන්න. ඒක මේ වෙලාවේ තමුසෙගෙ හදවතට දැනෙනව. හැබැයි තමුසෙ දැනගත්ත ඒ සිතුවිලි කවදාවත් ඒ පුද්ගලයාට දැනෙන්න දෙන්න එපා. තේරුණාද විමුක්ති."

මෙම අරුම චිපය සහිත මාලය පැළඳගත් මා මුලින්ම ඇතුළුවූයේ නුගේගොඩ "සාරි මන්දිර" වෙතටය. දෙනෝදාහක් ගැහැණු පිරිමි සාරි තෝරති. මුළු පළාතම පිරී ඇත්තේ දිස්න ගහන සාරිවලිනි. මමද සාරියක් තෝරන ආකාරයෙන් එක් සේවකයෙකු වෙත ගියෙමි. "සර් මොන වගේ සාරියක්ද බලන්නේ? වෙඩින් සාරිනම් එක එක ගණන් වලට තියෙනවා. හෝම්කමින් වලට නම් දැන් ඒක ඒක පාට ගන්නවනේ. ගොයින්ආවේ සාරින් එහෙමයි.

ඒවා නැතුව නිකං උත්සවයකට අඳින්න පුළුවන් සාරියක් බලමු

සේවකායා මදෙස නුහුරු බැල්මක් හෙළමින් සාරි තොගයක් මා ඉදිරියට දැමීය. මා අසලම සාරි තෝරමින් සිටි සුරූපි යුවතියන් දෙදෙනාද මට ඉදිරිපත් කල සාරි ගොන්න අතගෑවේ ඔවුන් බලා සිටි වර්ණවත් සාරි අතහරිමිනි. තමන් කොතරම් තේරුවත් අනුන් ගන්නා දේ කෙරෙහිද අවධානය යොමු කරන මෙබඳු යුවතියන් ලොව කොපමණ ඇද්දැයි මම මොහොතකට සිතුවෙමි.

සාරි ගැන මළඉලව්වක්වත් නොදන්නා මම සාරි තොග පිටින් ගෙන්වාගෙන බැලුවෙමි. මා ඒවායින් සෑහිමකට පත් නොවූ බව පෙන්වමින් මිල ගණන් විමසමින්, අඩු කරන්නේ නැද්දැයි අසමින් බොහෝ වේලාවක් එම වෙළඳ සේවකයා වෙහෙසට පත් කළෙමි. කොතරම් වෙහෙසට පත් කළද ඔහු කාරුණික වචන ඉස්සර කරමින්, කිසිඳු තරහක් මා කෙරේ නොපෙන්වීමට තරම් පරිස්සම් විය. ඔහුගේ රතු ඉර පරනීමේ සීමාව ඉක්මවා ගොස් තිබුණද ඔහු සිනාමුසු මුහුණින් සිටියි.

"තව ටිකක් බලමු මල්ලි" කියමින් ක්ෂණයකින් මම ඔහුගේ මැණික් කටුව මිරිකා ගතිමි.

පුදුමයකි. පුදුමයකි. ඔහුගේ සිත තුළ දැවෙන කෝපාග්නිත සිතුවිලි මට දැනෙන්නට විණ. එහෙත් තවමත් ඔහු මුවපුරා සිනාසෙමින් සිටියි.

"නොදකින් මේ කාලකන්නියා ! කොහෙන් පාත් උණාද මන්දා මගේ කාලෙත් කෑවා. ගත්තේ නැත්නම් ඉක්මනට මෙතෙනින් තොලෙන්චි වෙලා පලයන්."

"මල්ලි, මම වෙන වෙලාවක සාරියක් ගන්න එන්නම්කෝ" කී විට ඇතුළතින් කෝපාල්නියෙන් දැවෙමින් නමුත් මා දෙස සිනාමුසුව බලා සිටිනා සේවකයා මම වහා දුටිමි.

හුරුබුහුටි කොලු පැටියෙකු මාගේ ඇගේ හැපුණේ මා සාරි මන්දිරහි පියගැටපෙළ බසින අතරතුරය.

"මොන සිහියෙන් යනවද මන්දා. ඇස් පේන්නේ නැද්ද?"

දරුවාගේ මව මා වෙත කඩාපැන්නාය.

"බබාට තුවාල වුණාද?"

"නැහැ අංකල්, පොඩ්ඩක්වත් රිදුනේ නැහැ, " මම ඔහුගේ මැණික් කටුව ළඟින් අල්ලා නැගිටවූයෙමි. ඒ අහිංසක සිතුවිලි ධාරාව විපය හරහා මට දැනෙමින් තිබිණ. හිතා මතා කළ පරීක්ෂාවක් නොවුණද විපය පැළඳ සිටීම හේතුවෙන් කුඩා දරුවාගේ මුහුණේ පිළිඹිබු වූ සිතුවිලි ධාරාවම ඔහුගේ හදවතින් මනාලෙස මට දැනෙමින් තිබිණ.

මීට සතියකට පෙර මාගේ ලැප්ටොප් පරිගණක යන්ත්‍රය, එය මිලට ගත් සමාගමකට ආපසු ගෙනත් දුන්නේ එහි මතු වූ දෝෂ තත්ත්වයන් කිහිපයක් හේතුවෙනි. සාරි මන්දිරයෙන් පිටත් වී මම කෙළින්ම එහි ගියේ එය නැවත ලබාගැනීමටය.

"මාගේ ලැප්ටොප් එක හදලා ඉවරද?"

ඇල්ෆා ක්‍රිස්ටල් සමාගමේ කළමණාකරුගෙන් මම විමසා සිටියෙමි.

"ඔව් සර්, හදලා නම් ඉවරයි. මදර් බෝඩ් එකටම රුපියල් දාහදාහක් විතර ගියා, ගැරන්ටි පිරියඩ් එකත් ඉවරනේ. හොඳම මදර් බෝඩ් එකක් දැම්මෙ. මෙන්න බිල් එක. දැන්මම ගෙවලා ආවොත් ගෙනියන්න පුළුවන්."

"බොහොම ස්තුතියි " කියමින්ම මම ඔහුගේ අත අල්ලා ගතිමි.

"ෂහ් ! මූ නියමෙට අහුවුණා. පොඩි රෙපයාර් එකක් විතරයි තිබුණෙ. මෙහෙමවත් සම්‍යක්ප්‍රයෝගයක් කළේ නැත්නම් අපේ බිස්නසුත් වැටිලා ඉවරයි. දැන් ඉතින් ගෙවලා වරෙන්කෝ."

මගේ කළකිරීමට කෝපයට පත්වන අයුරක් මට දැනෙන්නට විය. මම බිලද අතැතිව මහ පාරට පැන්නෙමි. ඉහමොළ ගිනි ගන්නා තරම් රස්නයක් පැමිණියේ ඉර අව්වෙන් ද යන්න පසක් කරගන්නට මට නොහැකි විය.

ස්වප්නා හමුවීම යෙහෙකැයි ගිනි රස්නය මැද්දේම මම තීරණය කළෙමි. මහරගම මාගම්මන පාරේ ඇති ඇගේ කුඩා ඇනෙක්සියට මීට පෙර මම දෙතුන්පාරක් ගොස් ඇත්තෙමි. නුවරඑළියේ රූපගත කිරීම් අවසන්කර ඊයේ රාත්‍රී ඇය කොළඹට එන බව මට කලින්ම පවසා තිබිණ.

මාගම්මන පාරේ දෙවන පටුමගේ නිවසට මා යන විටත් ස්වප්නා සිටියේ නින්දේය.

"ආ.. විමුක්ති ! එන්න ඇතුලට" "මම ඔයාව හීනෙනුත් දැක්කා ඊයේ.."

ඇය පමණක් වෙසෙන ඇගේ නිවසේ පුංචි ආලින්දයේ මම වාඩි ගතිමි.

"ස්වප්නා කැන්දාගෙන එනකල් අපේ අම්මා බලාගෙන ඉන්නවා. ඔය අලුත් ටෙලි පරණ ටෙලි ඒවා බෑ එතකොට! සං එනකල් අම්මත් එක්ක වැඩපල කරගෙන ගෙදර ඉන්න වෙයි."

"ඔව් විමුක්ති, අපි ඉක්මනට වෙඩින් එක ගමු" ඇය බොහෝ ප්‍රේමාන්විතව පැවසුවාය.

ඇය මගේ ඇඟට බරවූයේ "විමුක්ති දැන්ම යන්නේ නැනෙ" යි අසමිනි.

"ටිකක් වෙලා ඉන්නවා. මගේ ඔළුව ටිකක් රිදෙනවා."

ඇය වහා ඕඩිකොලොන් බෝතලය රැගෙනවිත් ඔළුවට දමා මගේ ඔළුව පිරිමදින්නට වූවාය. මට ඇය කෙරේ සෙනෙහසක් දැනිණ.

"ඔයාට තේ එකක් හදන්නද? ස්වප්නා ඇසුවාය. "නෑ ඔහොම ඉන්න ටිකක් වෙලා. ඇය ආදරයෙන් මසිත ද පිරිමදී. ඇය අතිශයින්ම රූමත්ය. වසර දෙකක පමණ කාලයක සිට අපි ප්‍රේමයෙන් බැඳී සිටින්නෙමු. ඇය මගේ සහකාරිය වන දිනය එනතුරු මම මඟ බලා සිටිමි. ඇගේ ආදරය හා සිතුවිලි දැන ගැනීමට මට එම්.බී.ටී චිප් එක අවශ්‍ය නැත. ඇගේ ආදරය මට හොඳින් දැනේ.

"ඔයා දැන්ම යන්නේ නැනේ විමුක්ති?" ඇය දෙවන වරටද ඇසුවාය.

ඇගේ සුන්දර මුහුණ දෙස බලා සිටියෙමි.

"ඔයාව දාලා කොහොමද යන්නේ?"

"ඒක තමයි, මම තේ එකක් හදාගෙන එන්නම්"

ප්‍රේමයෙන් බර වූ දෑසට එබෙමින්, "පස්සෙ බොමු ස්වප්නා. දැන් ඔයා මගේ ළඟ ඉන්නකෝ " කියමින් මම ඇගේ අතින් අල්ලා මා සිටි පුටුව අසලින් වාඩිකර ගතිමි. මගේ ගත කිළිපොලා ගියේය. ඇගේ සුන්දර සිනාහව හා ප්‍රේමනීය බැල්ම මා වෙත යොමු වී තිබිණ.

"මෙයා මේ අවේලාවෙ කඩාපාත්වෙච්ච එකනේ වැඩේ. සහන් දැන් මේ වෙලාවට මඟ ඇති. ආවොත් හරිම ජංජාලයයි. ඊයේ නුවරඑළියේ ඉඳලා අපි දෙන්නම ආවෙත් එකට. මං කිව්වේ මට බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් නැහැ කියලා. කරුමෙට මෙයා මෙතනනේ. සහන් අද දවාලට මාව "රජබොජුන්" එකට ගෙනියනවා කිව්වා ලන්ච්වලට. ඒ වගේ සල්ලි තියෙන ප්‍රඩියුසර් කෙනෙක් මට හම්බවෙලාම නැහැ. මෙයාව ඉක්මනට යවා ගත්තොත් හොඳයි. කොහෙද තේ එකක් බීලවත් යන එකක්යැ" මට එලොව මෙලොව වටහා ගැනීමට අපහසු සෙයක් දැනුණි. ස්වප්නාගේ සිතුවිලි අතර මම දැවෙන්නට පටන් ගතිමි. මේ කුමන අරුමයක්ද? වසර දෙකක්ම දැඩි ලෙස ආදරය කළ, තවමත් ආදරය කරන ස්වප්නාගේ සිතුවිලි බලන්නට මේ භෞතික වස්තුවක් වූ චිප් එක අවශ්‍ය නොවන බව මම තීරණය කළේ මීට මොහොතකට පෙරය. මට වැරදුනේ කොතනද? වහා මම නැගිට "යන්නම්" කියමින් එළියට බැස්සෙමි.

මා තීරණය කළ යුත්තේ කුමක්ද? සමාජයේ හමුවන සෑම ගැහැණියකම සෑම පිරිමියෙකුම ඔවුන්ගේ චිත්ත අභ්‍යන්තරයේ ඇති සිතුවිලි ඒ අයුරින්ම අවංකවම එළියට නොදමන බවද? මතුපිට පෙනුමත් අභ්‍යන්තරයේ හැඟීමත් පරස්පර නොවන්නේද? මේ කෙහෙල්මල් බිලුටූත් චිප් එක දාගතහොත් සැබවින්ම මේ සමාජයේ ජීවත් වීමට නොහැකි තත්වයක් උදාවනු ඇත.


මිනිසුන්ගේ අභ්‍යන්තර සිතුවිලි බලා ජීවත්වීමට කවදාවත්ම නොහැකි යැයි මාගේ සිතට හැඟෙයි.

මම "එම්.බී.ටී" නම් වූ සෘජුකෝණාශ්‍ර චිප් එක ගෙලෙන් ගලවා ගත්තෙමි. මේක ආපසු ප්‍රොපෙසර් දොළපිහිල්ලටම බාරදෙනවා. මට මේක ගැළපෙන්නේ නෑ. මට විතරක් නෙමෙයි කාටවත්ම ගැළපෙන්නේ නෑ.

රන්වන් පාට පුන නූල සහිත එම්.බී.ටී චිප් එක කලිසම් සාක්කුවේ පතුලටම දාගත්තෙමි.

**මේජර් කමල් ශ්‍රී මනතුංගගේ (මියගිය)**
**"දොළොස් පැයේ සොඳුරු මෙහෙයුම"**
**කෙටිකතා සංග්‍රහයෙනි.**

**ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට අයත් නිළධාරියෙකු වූ මේජර් කමල් ශ්‍රී මනතුංග අපට සිටි දක්ෂ සාහිත්‍ය කරුවෙකි. ඔහු කවියෙකු, කෙටිකතා රචකයෙකු ලෙස ග්‍රන්ථ කිහිපයක්ම එළිදක්වා ඇත. "යුද බිමේ සිට ලියූ කවි" "බංකර් කුරුටු ගී" ඒ අයුරින් කැපී පෙනේ. මීට කළකට ඉහත දී හදිසියේ අප අතරින් සඳහටම සමුගත් ඔහු එවක ලියූ මෙම කෙටිකතාව මෙවර රණවරුණෙහි පළකරනුයේ ඔහුට උපහාර පිණිසය.**



# රහ කෑලි

## අයියා..

ඉන්දිකගේ පෙම්වතිය ඉරාෂා හට කොළඹින් රැකියාවක් ලැබුණි.

"මෙතන ලොක්කා කැමති නැහැ අපිව මුණ ගැහෙන්න පිරිමි ලමයි එනවට... ඒ නිසා හදිසියේ කවුරු හරි ඇහුවොත් කියන්න ඔයා මගේ අයියා කියලා..."

ඇය ඉන්දිකට කීවාය.

දිනක් හදිසියේම එහි ගිය ඉන්දික සමාගමේ පිළිගැනීමේ නිළධාරිණිය ලෙස කටයුතු කළ මැදිවියේ කාන්තාවගෙන් මෙසේ අසන්නට විය.

"මේ ඉරාෂා ඉන්නවද ? මම එයාගෙ අයියා.... "

''ආ ඇත්තද අදුර ගන්න ලැබුනට සන්තෝෂයි. මම එයාගෙ අම්මා...."



## මූණ..

දිනක් ඇමරිකාවේ බ්‍රිතාන්‍යයේ සහ ශ්‍රී ලංකාවේ තුන් දෙනෙක් වැවක නාන්නට ගියේය. ඇඳුම් සියල්ල ගලවා වතුරට බැස ස්නානය කළ මේ තිදෙනා ගොඩ පැමිණි පසුද ඇඳුම් ඇඳගන්නේ නැතිව ටිකක් වෙලා සනීපෙට හුලං වැදි වැදී සිටින්නට වූහ.

මේ අතර හදිසියේම එතනට පැමිණියේ කාන්තාවන් පිරිසකි. කලබල වූ ඔවුන් දඩිබඩි ගා තම ඇඳුම් ඇඳගැනීම සඳහා දුවන්නට විය. දුවන අතර වාරයේදී ඇමරිකාවේ සහ බ්‍රිතාන්‍යයේ දෙදෙනා තම තමන්ගේ රහස් ප්‍රදේශය අතින් වසා ගන්නටද අමතක කලේ නැත. එහෙත් තමන්ගේ රහස් ප්‍රදේශය වෙනුවට දෑතින්ම මුහුණ වසාගෙන දුවන්නට වූ අපේ මිනිහා දැක පුදුමයට පත්වූ අනිත් දෙදෙනා ඇඳුම් ඇඳගත්තාට පසුව ඒ ගැන ප්‍රශ්න කරන්නට විය.

මොකද මචං අපිදෙන්නා .......වහගන්නකොට උඹ විතරක් අත් දෙකෙන්ම මූණ වහගත්තේ

අනේ මචං උඹලගේ රටවල් වල නං කොහොමද කියලා මං දන්නේ නෑ. හැබැයි අපේ රටේ නං කෙනෙක්ව අඳුනගන්නේ මුහුණෙන්.

## අපූරු රැකියාව

ජීවත්වීම සඳහා රැකියාවක් සොයමින් ගිය පුද්ගලයෙකු සත්තු වත්තටද ගොඩවූයේ සත්තු වත්තෙන් හෝ රැකියාවක් සොයාගැනීමට සිතාය.  සත්තු වත්තේ මැනේජර් ගෙන් ඔහු වෙත ලැබුනේ සතුටු දායක පිළිතුරකි.

"අපේ සත්තු වත්තේ හිටපු ගෝරිල්ලා මේ දැන් මැරුණා.

මම දවසට රුː 350/= ක් දෙන්නං. ඔයාට තියෙන්නේ

මේ ඇඳුම ඇඳගෙන ගෝරිල්ලෙක් වගේ රඟපාන්ඩ..... ඔයාගේ පෆෝමන්ස් වල හැටියට කොමිෂන් එකක් ගෙවන්නං."

ගෝරිලි වෙස්ගත් අපේ මනුස්සයාද උසුළු විසුළු කරමින් නරඹන්නටත් අමුතු ආකාරයේ ආතල් එකක් දෙන්නට විය. එහෙත් ටික වේලාවකින් ගෝරිල්ලාගේ කූඩුව පසුකර ගිය නරඹන්නන් ඊට අල්ලපු කූඩුවේ වූ සිංහයා නැරඹීමට සෙට් විය. මේ වැඩේට එතරම් කැමැත්තක් නොදැක්වූ ගෝරිල්ලා සිංහයාගේ කූඩුවේ වැට උඩට නැග සිංහයාට උසුළු විසුළු කරමින් නැවතත් ප්‍රේක්ෂක අවධානය දිනාගන්නට විය.

ගත වූයේ සුළු වේලාවකි. වැටත් කඩාගෙන ගෝරිල්ලා සිංහ කූඩුවට වැටුණි. තමා දෙසට ළංවන සිංහයාදුටු ගෝරිල්ලා මර බයේ කෑගසන්නට විය.

"බුදු අම්මෝ මාව බේර ගනියෝ..."

පිම්මෙන් දෙකෙන් ගෝරිල්ලා දෙසට ළං වූ සිංහයා ගෝරිල්ලාගේ කට අතින් වසාගෙන මෙසේ කියන්නට විය.

"කෑ ගහන්නැතිව හිටපන් යකෝ. උඹ හදන්නේ අපි

දෙන්නගෙම රස්සාවල් නැති කරන්නද?"

## අලි ඔළුව

විදේස සංචාරයක නිරත වූ ඇලන්

තමා නැවති සිටි හෝටලයේ එල්ලා තිබූ

විවිධ සතුන්ගේ ඔළු දෙස බලා ඒ ගැන

හෝටලයේ අයිතිකරුගෙන් විමසන්නට විය.

ඇලන් :  "මේ අලි ඔළුව නම් හරි දැකුම් කළුයි."

හෝටල් අයිතිකරු :"ඕකා තමයි මගේ තාත්තව මැරුවේ"

ඇලන් :"ආ ඔයාගේ තාත්තා අප්‍රිකාවේ සංචාරය කලාද"

හෝටල් අයිතිකරු : "නෑ... නෑ... තාත්තා දවසක් ඔය ඔළුව හයි කරලා තියෙන තැනට පහළින් පුටුවක වාඩිවෙලා හිටිය"





# ස්වේච්ඡා බළසේනාවේ වෙසක් අසිරිය...



එළැඹි වෙසක් පුන් පොහෝ දින ස්වේච්ඡා බළසේනා මූලස්ථාන පරිශ්‍රය බොදු බැතියෙන් ඇලලී ගියේය. එහිදී ස්වේච්ඡා බළසේනා සාමාජික සාමාජිකාවන්ගේ හඬින් ගැයුණු බොදු බැති ගී සරණියක්ද මුල් වරට සංවිධානය කර තිබීම විශේෂත්වයකි. තවද රණවිරුවන්ගේ නිර්මාණශීලිත්වය විදහා දක්වුනු පහන් කූඩු ප්‍රදර්ශණයක් ද, බෙලිමල් දන්සැලක් ද එම වෙසක් කලාපයට එකතුව තිබිණ.

ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඒපී ද ඉසෙඩ් වික්‍රමරත්න ආර්ඩබ්ලිව්පී එන්ඩීයූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම පින්බර සැඳැවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි ඇතුළු ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ නිළධාරිහු රැසක්ද සෙබළ සෙබළියෝද ප්‍රදේශයේ සිවිල් ජනතාව විශාල පිරිසක්ද එකතු වූහ.
















තිස් වසක් පුරා මෙරට පැවති රුදුරු ත්‍රස්තවාදය අවසන් කොට ඉකුත් මැයි 19 දිනට
වසර 9ක් සම්පූර්ණ විය. වත්මන් පරපුරටද අනාගත පරම්පරාවටද නිදහස් නිවහල් දේශයක්
උරුම කරනු වස් එකී මව් බිම වෙනුවෙන් තම ජීවිත කැපකල දහස් සංඛ්‍යාත
රණවිරුවන් පිළිබඳ වූ මතක අප හදවත් තුළ සදාතනිකව නිදන් ගත කල යුත්තේ
එදවස ඔවුනගේ මෙහෙවර නොවන්නට අද අපට පය ගසන්නට බිමක් හෝ
නිදහසේ හුස්ම ගන්නට හැකි පරිසරයක් ඉතිරි නොවන නිසාමය ...
මෙවර "රණවරුණ" පසුකවරය වෙන් වෙනුයේ එකී උත්තම විරුවන් වෙනුවෙනි

# උපන් බිම රැකුමට
# උතුම් දිවි කැපකළ
# උත්තම විරුවන් වෙත පිදෙන
# හෘදයාංගම බුහුමන

**සැතපෙන මෙබිම නිහඬව හිඳින විකුමැති**
**හිතවත සොයුර ඉපදුන බිමට ණය නැති**
**අත මෙහි තබන රතු මල් පොකුරු සුවඳැති**
**පුත නුඹ නමට මිස අන් කුමට සුපිපෙති**

**හිස් කොට සියලු අණ වින සතුරු බිය මැකී**
**කෙස් කොට පවා දන්දී උපන් බිම රැකී**
**රැස් කොට උතුම් පින් එල නිවන් මග දැකී**
**පස් යට නිදන පුත නුඹ උතුම් රුවනකී**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ